# සිංහල

# 11 ශ්‍රේණිය

## කාර්ය පත්‍රිකා සංග්‍රහය




කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

# ඒකකය - දළදා පෙරහැර

**ගුරුභවතාගේ නම : පී.අචලා ප්‍රියදර්ශනී - අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 01

01. ඇසළ පෙරහැර මෙන් ඉංදියාවේ පවත්වනු ලැබූ උත්සවයේ නම සඳහන් කරන්න.

02. දළදා පෙරහැර ආරම්භ වීමට හේතු කාරක වූ කරුණු තුනක් සඳහන් කරන්න.

03. සතර දේවාලයේ පෙරහැරට දළදා මාලිගාවේ පෙරහැරක් එක් කරණ ලද්දේ කවර ස්වාමින් වහන්සේගේ අනුශාසනා පරිදිද?

04. වර්තමාන දළදා පෙරහැරේ ආරම්භය කුමන රජ දවසක දී සිදු වූවක්ද?

05. මහනුවර ඇසළ පෙරහැර බෞද්ධ මුහුණුවරක් ගන්නේ කෙසේ ද?

06. දළදා මාලිගාව ආශ්‍රිත උත්සව වලට අවශ්‍ය සියලු නැකත් සකස් කරන ලද්දේ කවුරුන් විසින් ද?

07. සතර දේවාල නම් කරන්න.

08. "කප් සිටුවීමේ" චාරිත්‍රය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

09. "දේවාල පෙරහැර" පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

10. "කුඹල් පෙරහැර" යනුවෙන් කුමක් අදහස් කරන්නේ ද?

11. "රන්දොලි පෙරහැර" පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන්න.

12. "දවල් පෙරහැර" පිළිබඳව කෙටි හැඳින්වීමක් සපයන්න.

13. දළදා පෙරහැරේ කටයුතු අවසන් කරන්නේ කෙසේද?

14. දළදා මාලිගාව ආශ්‍රිත ප්‍රධාන මංගල්‍ය තුනක් ලියන්න.

15. දළදා පෙරහැරෙහි ගමන් ගත් අලි ඇතුන්ගෙන් සංකේතවත් වූයේ කුමක් ද?

16. දළදා පෙරහැර පිළිබඳව ලියා ඇති ග්‍රන්ථවල නම් සඳහන් කරන්න.

17. මුල් යුගයේ ඇසළ පෙරහැර පිළිබඳව දක්වා ඇති විදේශීය මූලාශ්‍ර පිළිබඳව සඳහන් කරන්න.

18. දිය කැපීමේ චාරිත්‍රය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

19. දළදා පෙරහැර ජලය ආශ්‍රිත උත්සවයක් ලෙස සලකනු ලබන්නේ කවර පදනම් කරගෙන ද?

20. කස පිපිරවීමෙන් සංකේතවත් වන්නේ කුමක් ද?

21. නවගමුන පත්තිනි දේවාලයේ අලි ඇතුන් වෙනුවට යොදා ගනු ලබන්නේ කුමන සත්වයා ද?

22. පැරණි දලදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනයට වඩා රාජ්‍ය බලය පෙන්වීමේ අවස්ථාවක් වූ බවට සාධක ගෙන හැර දක්වන්න.

23. “මුල් යුගයේ දළදා පෙරහැරට වඩා වර්තමාන දළදා පෙරහැර බෞද්ධ මුහුණුවරක් ගනී.” මේ කියමන සමඟ ඔබ එකඟ වන්නේ ද? එසේ නම් හේතු දක්වන්න.

24. පාඩමේ සඳහන් විශේෂණ පද 05 ක් ලියන්න.

25. නිසා, විසින්, දක්වා, ද, සමග, යන නිපාත පද යොදා වාක්‍ය ලියන්න.

# ඒකකය - දුකට කියන කවි සීපද

**ගුරුභවතාගේ නම : ආර්.පී.ශ්‍යාමලි සමරලතා - අම්/දමන මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 02

- අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න. හිස්තැන් සම්පූර්ණ කිරීමට අවශ්‍ය පදය තෝරන්න.

01. පහත කවියේ හතරවන පදය සම්පූර්ණ කරන්න.

රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
පාන්දරට යන්තම් ඇස පියන්නේ
හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ
..........................................................................

i. දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ
ii. දෙගොඩ ගොඩින් නුඹ කොතැන ද සිටින්නේ
iii. මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
iv. හීනෙන් ඇවිත් නැනා අත වනන්නේ

02. "දුකට කියන කවි සීපද" පද්‍ය පංතිය රචනා කරන ලද්දේ,

i. චන්ද්‍රරතන මානවසිංහ
ii. පී.බී. අල්විස් පෙරේරා
iii. මහගම සේකර
iv. විමලරත්න කුමාරගම

03. පහත කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.

එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ
..........................................................................
දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ
දෙගොඩ ගොඩින් කොතැන ද නුඹ සිටින්නේ

i. මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
ii. දෙ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
iii. හීනෙන් ඇවිත් නැනා අත වනන්නේ
iv. පාන්දරට යන්තම් ඇස පියන්නේ

04. "දුකට කියනා සීපද" පද්‍ය පංතිය ලියා ඇති ආකෘතිය වන්නේ,

i. දෙපද එළිසමය සහිත
ii. සිව්පද එළිසමය සහිත
ii. සිව්පද එළිසමය රහිත
iv. දෙපද එළිසමය රහිත

05. (i) කවි පෙළෙහි වස්තු විෂය .......................................................................... වේ.

(ii) ජන කවියේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 04 ක් දක්වන්න.

(iii) ඔබ දන්නා ජන කවි වර්ගවලින් ජන කවි 03 ක් ලියන්න.

(iv) 'ජන කවිය මිනිස් දිවියේ කැඩපතයි'. මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

- ඉතිරි පද සම්පූර්ණ කරන්න.

06. පිංලේ පැදුර හේනට අරගෙන එනවා

..............................................................................

..............................................................................

..............................................................................

07. සීත කරන උඳුවප් මහ දුරුත්තේ

සීතල උහුලන්න මට බැරුවා සන්නේ

..............................................................................

..............................................................................

08. උඹේ කරට මල් මාලා ගොතන්නට

..............................................................................

..............................................................................

..............................................................................

09. පිළිතුරු ලියන්න.

i. හේනේ පිපෙන මල් වර්ග මොනවා ද? ......................................

ii. ජන කවි හා බැඳුණු ව්‍යක්තීන් මොනවා ද? ......................................

iii. ඔය අසන්න කියන්නේ කාට ද? ......................................

iv. එගොඩ ගොඩේ අඹන්නේ කවුද? ......................................

v. අවරට යන්නේ මොනවා ද? ......................................

vi. සිංහල ක්‍රමයට අනුව මාස 12 ලියන්න. ....... ...................................... ..................................

..............................................................................................................................

vii. මෙම පද්‍ය පංතියේ පද්‍ය ඇතුළත් ගීතය ගායනා කරන්නේ කවුද? ......................................

viii. කුහරන් වගාවට පෙර කරන්නේ මොනවා ද? ......................................

ix. කුරහන් දමන්නේ කිනම් පෙට්ටිවල ද? ......................................

x. නැනාගේ කරට ගොතන්නේ මොනවා ද? ......................................

xi. ගිරව් එන්නේ මොනවා අහන්න ද? ......................................

xii. ඇස පියෙන්නේ මොන වෙලාවට ද? ......................................

xiii. නැනාට එන්න යැයි කියන්නේ මොනවා නෙළන්නට ද? ......................................

xiv. උලලේනා අඬන්නේ කොහේ ද? ......................................

xv. කවියා මෙගොඩ ගොඩේ සිට මොනවාද කියන්නේ? ......................................

xvi. ලේඛන ආරම්භයට පෙර සාහිත්‍ය පැවතුණේ කෙලෙස ද? ......................................

xvii. එය රස විඳීම සිදුවූයේ කෙසේ ද? ......................................

xviii. උසස් සාහිත්‍ය නිර්මාණයක තිබිය යුතු අංග 02 ක් නම් කරන්න. ......................................

..............................................................................................................................

# ඒකකය - අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය

ගුරුභවතාගේ නම : ආර්.පී.ශ්‍යාමලි සමරලතා - අම්/දමන මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 03

❖ නිවැරදි පිළිතුර තෝරන්න.

1) නූතන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන.
(i) 54 (ii) 60 (iii) 61 (iv) 32

2) නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර ගණන.
(ii) 20 (ii) 18 (iii) 60 (iv) 42

3) නූතන සිංහල අක්ෂර මාලාවේ අන්තඃස්ථ අක්ෂර.
(iii) 03 කි (ii) 04 කි (iii) 05 කි (iv) 06 කි

4) අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර
(i) 08 කි (ii) 10 කි (iii) 12 කි (iv) 05 කි

5) නූතන සිංහල අක්ෂර මාලාවේ කෙටි ස්වර.
(iv) 10 කි (ii) 06 කි (iii) 08 කි (iv) 07 කි

6) සිංහල වර්ණ මාලාවේ "ඕ" අක්ෂරය,
(i) කණ්ඨ තාලුජ (ii) දන්තෞෂ්ඨජ (iii) කණ්ඨෞෂ්ඨජ (iv) තාලුජ

7) ඝෝෂාක්ෂර පමණක් අන්තර්ගත පිළිතුර,
(i) අ,ඉ,උ,එ,ඔ, (ii) ය,ර,ල,ව,ස (iii) ග,ජ,ඩ,ද,බ (iv) ප,ඵ,බ,භ,ම

8) සිංහල වර්ණ මාලාවේ අනුනාසික්‍ය අක්ෂර
(i) 04 කි (ii) 5 කි (iii) 6 කි (iv) 7 කි

9) අනුස්වාරය යෙදුන වචනය වන්නේ,
(i) සමන් (ii) ගංගා (iii) ඕලු (iv) වතුසුදු

10) අඝෝෂ ව්‍යඤ්ජන අක්ෂර,
(i) 15 කි (ii) 16 කි (iii) 12 කි (iv) 18 කි

11) රකාරාංශය, රේඵය, යංශය, ගැටපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(i) ශ්‍රමය,විතර්ක ,කාව්‍ය, පෘථිවිය (ii) කෘත්‍රිම, කර්මය,සත්‍ය, ග්‍රන්තය
(ii) නාට්‍ය, ක්‍රමය, තර්කය, කර්තෘ (iv) ධර්මය, ප්‍රධාන, කෘත්‍රිම, විද්‍යාව

12)'කතුර, සවිය, ප්‍රවීණ, මහාචාර්ය' යන වචන වල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(i) කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල හා ඇලපිල්ල.
(ii) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා දීර්ඝ ඉස්පිල්ල
(iii) කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා දීර්ඝ ඉස්පිල්ල
(iv) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, දීර්ඝ ඉස්පිල්ල හා ඇලපිල්ල

13) 'කහ ' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
(i) තාලුජ ය. (ii) කණ්ඨජ ය. (iii) දන්තජ ය. (iv) මූර්ධජ ය.

14) එක් එක් වචන වල මුලකුරේ ඇදය, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල සහ ඇලපිල්ල පිළිවෙලින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
(i) කැත්ත, කුරුල්ලා, මිටිය, කාලය (ii) සැත්කම, රූං පෙත්ත, සිනමාව, කාමරය
(ii) දෙසවන්, මුදල, දූපත, වැටකෙයියා (iv) ගෙදර, රූපය, දීකිරි, මාන්නය

15)රකාරාංශය, යංශය, විසර්ගය, අනුස්වාරය යෙදුණු පද අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. සහස්‍රය, වාක්‍යය, අන්තඃපුරය, සංඥාපනය,
ii. ප්‍රාර්ථනාව, වංචල, මණ්ඩලය, දුඃඛදායක
iii. චන්ද්‍රාය, සත්‍යය, වාග්මාලාව, කෛලාසය
iv. පරිනාමය, සෞඛ්‍යය, යන්ත්‍රය, මනඃකල්පිත

❖ 16-19 තෙක් සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
11) i. විශ්මය, පුස්තකාලය, විශ්වාශය, ප්‍රදර්ශනය
ii. විශ්ලේෂණය, ශ්‍රවණාගාරය, පර්යේෂණය, ජලාපවහනනය
iii.නිෂ්කලංකය, නිශ්ශබ්ද, සංගායනාව, තීරණය
iv.සමස්ත, ශිෂ්ටාචාරය, කනිෂ්ඨ, ගවේෂණය
12) i. වෛද්‍යාචාර්ය, සෞන්දර්යය, ඥානය, පිළියෙල
ii.මිථ්‍යාව, දිළිඳු, ජයග්‍රහණය, සංදර්ශණය
iii.ප්‍රතිමා, ඖෂධ, දීර්ග, නිපුණත්වය
iv.ගගණගාමී, ඓතිහාසික, භීෂණය, මිණිබරණි
13) i. විශ්මය, පුස්තකාලය, විශ්වාශය, ප්‍රදර්ශනය
ii. විශ්ලේසණය, ශ්‍රවනණාගාරය, පර්යේෂණය, ජලපවහනය
iii.නිෂ්කලංක, නිශ්ශබ්ද, සංගායණාව, තීරනය
iv.සමස්ත, ශිෂ්ටාචාරය, කනිෂ්ඨ, ගවේෂණය
14) i. ශිෂටාචාරය, ප්‍රවස්තිය, සම්ප්‍රධාය, දූෂ්ටිය
ii. ඖෂධාලය, තූර්යා වාදනය, සෞන්දර්යය, ලේකම්
iii.වර්ධනය, සව්ඨනය, වෛරය, වාර්තාව
iv.මද්‍යසාර, කෘත්‍රිම, ප්‍රස්තාරය, පරිගණකය

15) නූතන සිංහල අක්ෂර මාලාව ලියා ස්වර ව්‍යඤ්ජන වෙන් කොට දක්වන්න.
16) ව්‍යඤ්ජන අක්ෂර වර්ග කොට ඒ ඒ වර්ගයට අයත් අක්ෂර වෙන් වශයෙන් ලියන්න.
17) අල්පප්‍රාණ අක්ෂර නම් කරන්න.
18) මහාප්‍රාණ අක්ෂර නම් කරන්න.
19) දිග් ස්වර ලියා දක්වන්න.
20) කෙටි ස්වර ලියා දක්වන්න.

# ඒකකය - විශ්ව කෝෂය

**ගුරුභවතාගේ නම : එන්.යූ.වී.තිලංගනී බණ්ඩාර - අම්/පොල්වත්ත මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 04

❖ උපදෙස් - " විශ්ව කෝෂය " හොඳින් කියවා පෙළ පොත ඇසුරු කර ගනිමින් පිළිතුරු ලියන්න.

01. විවිධ පොත පත ..................................... කර ගැනීමට මෙන් ම විවිධ විෂය කරුණු සොයා ගැනීමට ද පාඨකයන්ට .................................. මහත් පිටු බලයක් සැපයේ.

02. බොහෝ විට මේවා .................................. කාණ්ඩ කිහිපයක් පළ කෙරේ.

03. ශත වර්ෂයේ මුල් කාලයේ දී .................................. විසින් ............................ කරන ලද වාරි කර්මාන්ත අතුරෙහි ඉරණමඩු වැදගත් වේ.

04. ඉර රාජ හා පැලැටි බෙහෙවින් වැඩෙන්නේ ................................ පළාතේ තෙත් මූකලාන් වලය.

05. මාලි ගඟ මෙන් ම ....................................... ගඟ ද ................................... විසින් හඳුන්වනු ලබන්නේ .................................. නමිනි.

06. භාෂාවක .................................. පිළිවෙළ සකස් වන්නේ එහි ............................... සකස් වී ඇති ආකාරයට ය.

07. සිංහල හෝඩියේ අක්ෂර .................................. බොහෝ දුරට ...................................... අකාරාදි පිළිවෙළ අනුව සකස් වී ඇත.

08. හල් වූ ව්‍යඤ්ජනාක්ෂරය ............................... මාලාවේ මුලට හෝ ......................... හෝ යෙදිය හැකිය.

09. අනුස්වාරය හා ............................ ව්‍යඤ්ජනාක්ෂර වන නමුදු .............................. නොයෙදෙයි.

10. ව්‍යඤ්ජන ශබ්දයකට ඉදිරියෙන් ................................. ශබ්දය ලියා දැක්වීම පිණිස යෙදෙන සංකේතය ............................... නම් වේ.

11. "ඥ" යනු ................................. ව්‍යඤ්ජනයක් හෙයින් එය ................................ ඇතුළත් නොවන සංකේතයකි.

❖ කෙටි පිළිතුරු සපයන්න.

01. සිංහල භාෂාවේ එක් එක් විෂය යටතේ පැළකොට ඇති විශ්ව කෝෂ මොනවාද?

............................................... ...........................................................

02. සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන කීයද? ...................................................................................

03. රේපය යෙදුණු වචන 05ක් ලියන්න.

......................................................................................................................................

......................................................................................................................................

04. සිංහල හෝඩියේ අකුරු අතරින් මුලට නොයෙදෙන අක්ෂර ගණන කීයද? ......................................

05. එම අක්ෂර ලියා දක්වන්න.

..........................................................................................................................................

06. රකාරාංශය යෙදුණු වචන පහක් ලියන්න.

..........................................................................................................................................

07. පහත වචන අකාරාදී පිළිවෙළට සකස් කරන්න.

1. ඉරවඩී , ඉරණමඩු , ඉරබටු තරුව , ඉරරාජ් , ඉරමුසු

..........................................................................................................................................

2. කොළඹ , රුහුණ ,රජරට , මොරටුව , කැලණිය

..........................................................................................................................................

3. නන්දපාල , නේමින්ද , තේමිය , ගුණපාල ,රසවතී

..........................................................................................................................................

4. ඔටුවා , අලියා , පැස්බරා , වඳුරා , කොටියා

..........................................................................................................................................

5. ලන්තැරුම , දියමන්ති , ගල්ලැල්ල , ගුහාව , වංචල

..........................................................................................................................................

6. විශ්ව විද්‍යාලය , රෝහල , දුම්රිය ස්ථානය , වෙළඳසැල , පදික වේදිකාව

..........................................................................................................................................

7. විදේශීය , සංචාරකයා , ගායිකාව , ශිෂ්‍යයා , රංගනවේදියා

..........................................................................................................................................

8. ගුරුවරයා , වෛද්‍යවරයා , කම්කරුවා , පෙදරේරුවා , රියදුරා

..........................................................................................................................................

08. පාඩමෙන් සොයා තත්සම වචන 05ක් ලියන්න.

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

# ඒකකය - රසින් රස මවන බස් මහිමය

**ගුරුභවතාගේ නම : එන්.යූ.වී.තිලංගනී බණ්ඩාර - අම්/පොල්වත්ත මහා විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 05**

❖ **පෙළ පොතේ "රසින් රස මවන බස් මහිමය" පාඩම ඇසුරින් පිළිතුරු සපයන්න.**

01. ශාස්ත්‍රීය ලේඛනයක දී ................................ ද නිර්මාණාත්මක ලේඛනයේ දී ..............................ද වචන සංකලනය කළ යුතුය.

02. ප්‍රකාශන විලාසය හා ................................ දෙක සෑපුවම භාෂා භාවිතය සම්බන්ධ ....................... වශයෙන් සැලකිය හැකිය.

03. රචනා රීතිය යනු ............................ දී ............................ලෙස කෙරෙන පද ගැලපීමයි.

04. වැඩිදෙනා ........................... ව්‍යවහාරය අනුගමනය කරද්දී ඇතමෙක් .............................. අනුගමනය කෙරෙති.

05. මුද්‍රණ ශිල්පය ................................ සමඟ පොත් පත් ............................... ව්‍යාප්ත වේ.

06. සමහරු ............................... හැඳින්වීමට ද ............................... යන්න යොදති.

07. අසා රසවිඳීමටගොඩ නැගුණු .......................................... වින්දනාත්මකව කියවා රස විඳීමට උචිත ......................................... යොදා ගැනීමේ අභියෝගය මෙකළ ......................................... හමු වේ පැවතිණි.

08. සිංහලයේ බෝ යනුවෙන් හඳුන්වනු ලබන විශාල .................................... හෝ ........................... ශාකයක් හෝ නුග ස්වරූපී ශාකයකි.

09. ශාකයේ ................................නොව එහි ව්‍යාප්තිය හා ඊට අදාළ ................................ පසුබිම සම්බන්ධ විස්තරයෙනි.

10. අද බිහිවන ................................ නිර්මාණ ද ................................ රටාවෙන් මිදී ...................................... රටාවට අනුකූල වන සේ ලියැවෙයි.

❖ **පහත සඳහන් පාඨවල ඉරි ඇඳි පද වල අර්ථය ලියන්න.**

01. එක් තිඹිරි රුකකට නැගී <u>නොවිලික්සුණු</u> ඵල අනුභව කරනුයේ ..................................................

02. අතිගාම්භීර ප්‍රපාතයෙහි වැටී <u>ක්ෂුධාවෙන්</u> පෙළී කෙදිරි ..................................................

03. විසිතුරු තුරඟ <u>පොකුරු ලබ</u> දෙන සුවපත් ..................................................

04. මේ <u>අසේව</u> වැඳහොත් වඳුරා ..................................................

05. තත් සහගත වූ ව්‍යාකරණ <u>නිරුක්ති</u> ඡන්දෝලංකාර ..................................................

❖ පහත පාඨ අයත් ග්‍රන්ථය තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| 1. | විහඟ ගණයාගේ මධුර ඣංකාර ........ | ප්‍රබුද්ධ |
| 2. | වැව බඳිනා තැනට එවුවේ ....... | සාහිත්‍ය විද්‍යාව |
| 3. | එම්බල පුරුෂය තා කෙරෙහි .... | සිළුමිණ සඟරාව |
| 4. | මම ඔවුන්ගේ තොවිලෙට ගිහිල්ල | රාජාවලිය |
| 5. | උපදේශයෙන් පමණක් නොව ආදර්ශයෙන් | සෙංකොට්ටම් |
| 6. | දඹ රත්රන් කැටයමක් ය. | සද්ධර්ම රත්නාවලිය |
| 7. | ලා දම් පැහැයෙන් යුක්තවූ | පන්සිය පනස් ජාතක පොත |

❖ විරුද්ධ පද ලියන්න.

1. ආධ්‍යාත්මික - ..................................
2. අවිනිශ්චිත - ..................................
3. ආගන්තුක - ..................................
4. විශ්වාසය - ..................................
5. දේශිය - ..................................
6. ප්‍රවීණ - ..................................
7. සම්මාන - ..................................
8. විශිෂ්ට - ..................................
9. නින්දා - ..................................
10. ප්‍රතිභාව - ..................................

❖ පහත සඳහන් වචන නිවැරදි අක්ෂර යොදා නැවත ලියන්න.

1. මර්ධනය - ..................................
2. ඖෂද - ..................................
3. කොට්ඨාෂය - ..................................
4. විශිෂ්ය - ..................................
5. පුත්ථකාලය - ..................................
6. ආරෝහන - ..................................
7. මනශ්කාන්ත - ..................................
8. සම්ප්‍රධාය - ..................................
9. සජ්ජායනය - ..................................
10. ප්‍රශ්ණය - ..................................

# ඒකකය - වාක්‍ය රීති

**ගුරුභවතාගේ නම : පී.අචලා ප්‍රියදර්ශනී - අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 06

1) පහත සඳහන් වාක්‍ය නිදොස් කොට ලියන්න.
   i. ඔවුන් විවාදයේ දී හොඳින් තර්ක කළහ යි ප්‍රේක්ෂකයන් පැවසූහ.
   ii. නළුවෝ රඟුමක් පාති යි ප්‍රේක්ෂකයෝ අපේක්ෂා කළහ.
   iii. ළමයින් හොඳින් පිළිතුරු ලියති යි දෙමව්පියන් සිතති.
   iv. ඔවුහු පහර දෙති යි අපි බිය වීමු.
   v. මගීහු මාර්ග නීති පිළිපදිති යි පොලිස් නිලධාරීහු සිතුවෝ ය.

2) වරහන් තුළින් තෝරාගෙන හිස්තැන් පුරවන්න.
   i. ධාවන පථයේ ............................................. නැත. (ක්‍රීඩකයෝ / ක්‍රීඩකයන්)
   ii. ........................................ අතුරුදහන් වී ඇත. (ළමයෙක් / ළමයෙකු)
   iii. ........................................ ඒ ප්‍රදේශයේ නැත. (කැරලිකරුවන් / කැරලිකරුවෝ)
   iv. ........................................ බස් රියෙහි නැත. (මගීන් / මගීහු)
   v. ........................................ කුඹුරේ නැත. (ගොවියෝ / ගොවියන්)

3) පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.
   i. සංචාරකයෝ ශ්‍රී පාදය තරඹා නැත.
   ii. මගීහු බස් රියට ගොඩ වී නැත.
   iii. ශිෂ්‍යයෝ විභාගයට සූදානම් වී ඇත.
   iv. ගවයෝ තණ පිටියට පැමිණෙනු ඇත.
   v. ගම්වැසියෙක් කතාවක් පවත්වනු ඇත.

4) පහත සඳහන් වාක්‍ය සඳහා නිවැරදි ආඛ්‍යාතය ලියන්න.
   i. ගොවියෝ හා ගෙවිලියෝ කුඹුරේ වැඩෙහි නිරත .....................................
   ii. ගස් හා වැල් පරිසරය අලංකාර ......................................
   iii. කම්කරුවෝ සහ සේවාදායකයෝ ඒ ප්‍රශ්නය පිළිබඳ සාකච්ඡා ................................
   iv. නළුවෝ හා නිළියෝ වේදිකාවේ රංගනයක ........................................
   v. ඉර හා සඳ පෘථිවිය ආලෝකවත් ...............................................

5) වරහන් තුළින් සුදුසු පදය තෝරන්න.
   i. අපි (ශිෂ්‍යයෝ / ශිෂ්‍යයන්) හා පිළිසඳරෙහි යෙදුණෙමු.
   ii. ගුරුවරු (දෙමාපියන් / දෙමාපියෝ) හා සාකච්ඡා කරති.
   iii. (මම / මා) ඔවුන් හා ගමනට එකතු වීමි.
   iv. (දරුවෝ / දරුවන්) දෙමව්පියන් හා විදේශගත වූහ.
   v. මම (ඔවුන් / ඔවුහු) හා මිත්‍ර වීමි.

6) සුදුසු ආඛ්‍යාත පදය යොදන්න.
   i. අම්මා යෙහෙළියක සමඟ පොළට ........................................
   ii. සිංහයා පැටවුන් කැටුව ලෙන තුළට .....................................
   iii. සිවුපාවෝ පක්ෂීන් සමඟ වනය අත්හැර .....................................
   iv. ගුරුවරු ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක නිරත .................................
   v. මම ඔවුන් සමඟ ගමනට සහභාගී ........................................

7) පහත දැක්වෙන වාක්‍ය නිවැරදි කොට ලියන්න.

i. ක්‍රීඩිකාවෝ නොහොත් ශිෂ්‍යාවන් කෙළි බිමට පිවිසුණෝ ය.

ii. විදුහල්පතිවරු හෝ ගුරුවරුන් දේශනය පවත්වති.

iii. නිලධාරීන් නොහොත් පාලකයෝ විදේශගත වූහ.

iv. මගීහු නොහොත් රියදුරන් මාර්ග නීති කඩ නොකළහ.

v. වෛද්‍යවරුන් නොහොත් වෛද්‍ය අධ්‍යක්ෂකවරු කොවිඩ් රෝගය පාලනය කරති.

8) හිස්තැනට සුදුසු පද ලියන්න.

i. ශ්‍රී ජයවර්ධනපුර හෙවත් ............................................ අපේ රටේ අගනුවරයි.

ii. චන්ද්‍රයා හෙවත් සඳ ලොව එළිය ....................................

iii. මව හෙවත් අම්මා දරුවන් ආරක්ෂා ............................................

iv. දිනකර හෙවත් ...................................... සැඩ හිරු රැස් පතුරවයි.

v. මිගිඳා හෙවත් සිංහයා වනයේ අණසක ..........................................

9) සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

i. ඔහු (තිරිසනෙක් / තිරිසනෙකු) වැනි මිනිසෙකි.

ii. ඇය (දෙවඟනක් / දෙවඟනක) මෙන් සැරසී සිටියා ය.

iii. මම දක්ෂ (කථිකයෙකු / කථිකයෙක්) ලෙස කථාවක් පැවැත්වූවෙමි.

iv. මම (වාර්තාකරුවෙකු / වාර්තාකරුවෙක්) ලෙස පෙනී සිටියෙමි.

v. අපි යහපත් (මිනිසුන් / මිනිස්සු) සේ කටයුතු කරමු.

10) පහත දැක්වෙන කර්මකාරක වාක්‍ය කර්තෘකාරක වාක්‍ය බවට හරවා ලියන්න.

i. උයන්පල්ලා විසින් මල් උයන ආරක්ෂා කරන ලදි.

ii. ගුරුවරියක විසින් ළමයින්ට අකුරු උගන්වනු ලැබීය.

iii. ලියා විසින් දරුවෝ රකිනු ලබති.

iv. වෛද්‍ය විශේෂඥයන් විසින් කොවිඩ් රෝගය නිවාරණයට ඖෂධ නිපදවනු ලබයි.

v. පාඨකයන් විසින් ගත් කතුවරුන් අගයනු ලබති.

11) පහත කර්තෘකාරක වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට හරවා ලියන්න.

i. වෙළෙන්දෝ පාරිභෝගිකයන් හමුවෙති.

ii. ආණ්ඩුකාරයා රැස්වීමට නියෝජිතයන් පාලම තනා නිම කළහ.

iii. ගොපල්ලෝ ගවයන් බඳිති.

iv. ළමයි ක්‍රීඩා පිටියේ සෙල්ලම් කරති.

v. ඉංජිනේරුවෝ කඩිනමින් පාලම තනා නිම කළහ.

# ඒකකය - වාක්‍ය රචනය

**ගුරුභවතාගේ නම : එච්.එම්.රේණුකා සිරිවර්ධන - අම්/පරහගකැලේ මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 07

01) වාක්‍ය රචනය යනු කුමක් ද?

02) වාක්‍ය රචනයක දළ ආකෘතිය ලියා දක්වන්න

03) සාර්ථක රචනයක දැකිය හැකි ලක්ෂණ මොනවා ද?

04) ශිල්පීය දක්ෂතා යනු කුමක් දැයි පහදන්න.

05) පහත එක් එක් මාතෘකාව යටතේ වාක්‍ය රචනය බැගින් ලිවීම සඳහා අදාළ කරුණු අංක 5ක් යටතේ සංවිධානාත්මකව පෙළගස්වන්න. (රචනා සැකිලි නිර්මාණය කරන්න)

i. විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කරමු

ii. දේශීය සංස්කෘතිය රැක ගනිමු.

iii. රිය අනතුරු වළකමු.

06) පෙළ පොතෙහි 55 පිටුවේ 3 වැනි අභ්‍යාසයෙහි (i), (ii), (iii) යන විස්තරයන්ට අදාළව සපයා ඇති රචනා සැකිල්ලට අනුව යමින් නිර්මාණාත්මක රචනා ගොඩනගන්න.

(i) ප්‍රවේශය (පරිගණක තාක්ෂණය පිළිබඳ හැඳින්වීම)

- පරිගණක තාක්ෂණය හරහා සමාජයට සැලසෙන යහපත.
- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂමව කර ගැනීමට පරිගණකය දායක වන ආකාරය.
- පරිගණකය භාවිතයෙන් සිදුවිය හැකි අකටයුතු ක්‍රියා.
- අවභාවිතයෙන් තොරව පුද්ගල යහපත වෙනුවෙන් පරිගණකය නිසි භාවිතයට යොදාගන්නා ආකාරය.

(ii) ප්‍රවේශය (සාහිත්‍ය පිළිබඳ හැඳින්වීම)

- සාහිත්‍යයේ අගය
- එතුළින් සමාජික, සංස්කෘතික, දේශපාලනික තොරතුරු නිරූපණය වන බව.
- පුද්ගල ආකල්ප වර්ධනය සඳහා සාහිත්‍යයේ බලපෑම.
- යහපත්, සාමකාමී, ගුණධර්ම හෙබි පුද්ගලයෙක් බිහි කිරීමට සාහිත්‍ය ඉවහල් වන බව.
- අවසානය.

(iii) ප්‍රවේශය (පුවත්පත ප්‍රබල මුද්‍රිත මාධ්‍යයක් ලෙස හැඳින්වීම)

- පුවත්පතේ වැදගත් සමාජ කාර්ය භාර්ය.
- ජනතාවගේ දැනුම, ආකල්ප පෝෂණයට පුවත්පත ඉවහල් වන ආකාරය.
- හානිකර පුවත් පළ කිරීම නිසා රටට වන හානිය.
- පුවත්පතේ නිසි වගකීම සමාජ සුචරිතය බව
- අවසානය.

# ඒකකය - සාහිත්‍ය රසවින්දනය හා විචාරය

**ගුරුභවතාගේ නම : ආර්.එම්.නිලූකා රණසිංහ - අම්/කාවන්තිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 08

01. සාහිත්‍ය නිර්මාණ මූලික වශයෙන් වර්ගකර ඇති ආකාර 03 මොනවාද?
02. සාහිත්‍ය පෝෂණය වීම කෙරෙහි බලපා ඇති කරුණු මොනවාද?
03. සාහිත්‍ය නිර්මාණයක් රස විඳීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
04. සාහිත්‍ය විචාරය යනුවෙන් පාඩමේ සඳහන්අකාරයට අර්ථ දක්වා ඇත්තේ කෙසේද?
05. යම් සාහිත්‍ය නිර්මාණයක් රස විඳීමේ දී හෝ විචාරය කිරීමේදී විචාරක අවධානය යොමු විය යුතු කරුණු මොනවාද?
06. නිර්මාණකරුවා අත්දැකීම් ලබාගන්නා විධි ක්‍රම 3ක් ලියන්න.
07. නිර්මාණකරුවා සිය නිර්මාණ උදෙසා තෝරා ගන්නේ කුමන ආකාරයේ අත්දැකීම් ද?
08. යම් නිර්මාණයක් විචාරය කිරීමේ දී විචාරකයාගේ විමසුමට බඳුන් විය යුතු කරුණු මොනවාද?
09. පහත දැක්වෙන නිර්මාණ රචනා කළ රචකයින්ගේ නම් පාඩම ඇසුරෙන් සොයා ලියන්න.

| නිර්මාණයේ නම | රචකයාගේ නම | නිර්මාණයේ නම | රචකයාගේ නම |
|---|---|---|---|
| වැහි වලාකුළු පදා පන්තිය | | මුවදෙව්දාවත | |
| වක්කඩ බඳිමු | | කව්සිළුමිණ | |
| උදය | | කාව්‍යශේඛරය | |
| අසත් පත්තිනි දේවතාවී | | හංස සංදේශය | |
| ගම අමතකයි | | සැළලිහිණි සංදේශය | |
| සිනා කුමාරි | | ගිරා සංදේශය | |
| පියසේන ඇසූ ප්‍රශ්නයක් | | බුත්සරණ | |
| කුකුළු හැවිල්ල | | ගුත්තිල කාව්‍ය | |
| අලුත ගෙනා මනාලිය | | සූනේත්‍රා | |
| නිර්මාණ පසුබිම | | හුණුවටයේ කතාව | |

10. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

I භාෂාව
II භාවික ගුණය
III අපූර්ව පද සංඝටනය
IV සංකල්ප රූප
V උපමා
VI රූපක
VII අතිශයෝක්තිය
VIII ස්වභාවෝක්තිය
IX ශබ්ද රසය
X විරිත

11. පද්‍ය පන්තියක ශබ්ද රසය හා අර්ථ රසය දැනවීම සඳහා නිර්මාණකරුවන් යොදා ගන්නා කාව්‍ය උපක්‍රම කිහිපයක් පහත දක්වා ඇත.ඒ පිළිබඳ අවධානය යොමුකරමින් දී ඇති කවි පන්ති පිළිබඳ රසවින්දනයක් කරන්න.

- ❖ ආකෘතිය
- ❖ උපමා
- ❖ රූපක
- ❖ අනුප්‍රාස
- ❖ එළිසමය
- ❖ විරිත්භාවිතය

විදෙන ලෙලෙන නරුබර පුළුලු ·කුල රැඳි
හෙළන නගන අත නුවනංග බැලුම් දිදී
රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදි
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී

ලකළ පුලුළුංකුල බඳ මිණි මෙවුල්ලා
සමග රන්සළඹ රැව් දී වෙවුල්ලා
වයන පදට තබමින් පද කමල්ලා
රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා

# ඒකකය - දියවර සිරිසර

එච්.ඩබ්.තමරා නිල්මිණි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්පාර

කාර්ය පත්‍රිකා අංක 09

1) පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

i. ශ්‍රවණය මූලික කරගත් ප්‍රබල සන්නිවේදන මාධ්‍ය වන්නේ,
   a) ගුවන් විදුලියයි
   b) රූපවාහිනියයි
   c) පරිගණකයයි
   d) පුවත්පතයි

ii. ශ්‍රවණය මගින් කරුණු ධාරණය කර ගැනීමට නම් සවන්දිය යුත්තේ,
   a) අසීරුවෙනි
   b) අවධානයෙනි
   c) උදාසීනත්වයෙනි
   d) මහන්සියෙනි

iii. විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම මගින්,
   a) දැනුම වර්ධනය කරගත හැකිය.
   b) පුළුල් ජීවිතාවබෝධයක් ලද හැකි ය.
   c) කාලීන වැදගත් තොරතුරු දැනගත හැකි ය.
   d) ඉහත සියල්ල ම නිවැරදි ය.

iv. මේ මාධ්‍ය වැඩසටහනින් සාකච්ඡා කරනු ලබන්නේ,
   a) වන සම්පත ගැනයි
   b) වායු සම්පත ගැනයි
   c) ජල සම්පත ගැනයි
   d) සත්ව සම්පත ගැනයි

v. ජල සම්පත පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,
   a) ජලය ආයාසයෙන් ලබාගත යුතු සීමිත සම්පතකි.
   b) ජීවයේ සම්භවයට හේතු වී නැත.
   c) පෘථිවි පෘෂ්ඨයෙන් වැඩි ප්‍රමාණයක් ජලයෙන් වැසී ඇත.
   d) පිරිසිදු ජලය දුර්ලභ දෙයකි.

vi. ජලය හා බැඳුණු සංස්කෘතික වටිනාකමක් නොවන්නේ,
   a) විවාහයේ දී අතපැන් වත් කිරීම
   b) මරණයේ දී පැන් වැඩීම
   c) බෝග වගාවන්ට ජලය යෙදීම
   d) පෙරමගට පිරුණු දිය කළයක් ගෙන ඒම

vii. අතීත හෙළයාගේ ජල කළමනාකරණ ශක්තිය පෙන්නුම් කරන්නේ,
   a) වැසි ජලය වැව්වල එක්රැස් කර සුරක්ෂිත කිරීම
   b) වාෂ්පීකරණය අවම කිරීමට ජලජ ශාක පැතිරීමට ඉඩ හැරීම
   c) වැව ඉහත්තාවේ ගස් ගොම්මන කට්ටකඩුව නිසා සුරක්ෂිත වීම
   d) ඉහත පිළිතුරු සියල්ල ම නිවැරදි ය.

viii. ඇළමාර්ග දෙපස කුඹුක් ගස් සිටවීමේ අරමුණ වූයේ,
   a) ගලා යන දියේ වාෂ්පීකරණය අවම කිරීම
   b) ඇළ කණ්ඩි සේදී යාම වැළැක්වීම
   c) කුඹුක් ගසේ මූල පද්ධතිය ඇළ කණ්ඩියට ශක්තියක් වීම
   d) ඉහත කරුණු සියල්ලම

ix. 'භූතල ජල ගබඩා ඇති කිරීම' ලෙස හඳුන්වා ඇත්තේ,

a) කුඩා වැව් පොකුණු නිර්මාණය කිරීම

b) වැසි ජල ටැංකි හඳුන්වා දීම

c) බින්දු ජල සම්පාදනය

d) පුරාණ වැව් ප්‍රතිසංස්කරණය කිරීම

x. ජල සම්පත විනාශ වීමට ප්‍රධාන ම හා එකම වගකිවයුත්තා නම්,

a) හිරු එළියයි. c) මිනිසායි.

b) සත්ත්ව සංහතියයි. d) රජයයි.

2) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. මේ පාඩමට අනුව ජලය සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක දත්ත පහක් උපුටා ලියන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

ii. ජල සම්පත පිළිබඳ දුර දක්නා නුවණින් කළ වටිනා ප්‍රකාශයක් මෙම සාකච්ඡාවේදී කියැවේ. එම ප්‍රකාශය උපුටා දක්වන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

iii. 'යෝධ ඇළේ ජල බැස්ම සැතපුමකට අඟලයි' මින් සැලසෙන වාසිය කුමක් ද?

.....................................................................................................................

.....................................................................................................................

iv. 'පරිසර සිරිසර' ගුවන් විදුලි වැඩසටහනට එකතු වූ විද්වතුන් දෙපළ නම් කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

v. 'ජල කළමනාකරණය' යන මැයෙන් වචන 250ක පමණ රචනයක් ලියන්න.

# ඒකකය - ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්

**එච්.ඩබ්.තමරා නිල්මිණි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්පාර**

කාර්ය පත්‍රිකා අංක 10

1) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

i. ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා ............................................... ජාතිකයෙකි.

ii. ඔහු දිවයිනේ පිහිටවූ පළමු විශ්ව විද්‍යාලය ....................................................... ලෙස හඳුන්වයි.

iii. ඔහු විසින් ශ්‍රී ලංකාවට .................................................................සම්පාදනය කර දුනි.

iv. ජෙනිංග්ස් මහතා උපත ලැබුයේ එංගලන්තයේ ............................................... නුවර දීය.

v. මෙතුමා කේම්බ්‍රිජ් සරසවියේ ...................................................... උපාධියෙන් පිදුම් ලැබුවෙකි.

(බැරිස්ටර් , ලංකා විශ්ව විද්‍යාලය , බ්‍රිතාන්‍ය , ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, බ්‍රිස්ටල්)

2) පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ජෙනිංග්ස් මහතා ලංකා විශ්ව විද්‍යාලයේ උන්නතිය උදෙසා සිදු කළ මෙහෙවර හතරක් ලියා දක්වන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

ii. මෙතුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථ හතරක් නම් කරන්න.

.......................................................................................................

.......................................................................................................

iii. ඔහු ලංකා විශ්ව විද්‍යාලය වෙනුවෙන් දිවා රෑ වෙහෙසුණු ආකාරය පිළිබිඹු කරන ප්‍රකාශය උපුටා දක්වන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

iv. අයිවර් ජෙනිංග්ස් මහතා දැරූ තනතුරු මොනවාද?

.......................................................................................................

.......................................................................................................

v. අයිවර් ජෙනිංග්ස් මහතාගේ ස්වයං චරිතාපදානයේ නම ලියන්න.

.......................................................................................................

vi. ලංකා විශ්ව විද්‍යාලය මහනුවර ප්‍රදේශයේ පිහිටවිය යුතු බවට තීරණය වූයේ කුමන හේතුවක් නිසා ද?

.......................................................................................................................

.......................................................................................................................

vii. ලංකා විශ්ව විද්‍යාලයට සැලසුමක් ඉදිරිපත් කිරීම සඳහා පත් වූ කමිටුවේ ප්‍රධානියා කවරෙක්ද?

.......................................................................................................................

viii. විශ්ව විද්‍යාලයේ භූමි සැලසුම් සම්පාදනය කළ බ්‍රිතාන්‍ය ජාතික වාස්තු විද්‍යාඥයා කවුද?

.......................................................................................................................

3) පහත දැක්වෙන පදවල උපසර්ග වෙන්කොට ලියන්න.

i. ප්‍රතිඵල - ..............................
ii. අනුබද්ධිත - .........................
iii. උපකුලපති - ........................
iv. විශිෂ්ට - ..............................
v. සුප්‍රකට - ..............................
vi. අතිදක්ෂ - ............................
vii. සුපුෂ්පිත - ............................
viii. ප්‍රවර්ධන - ..........................
ix. අධිරාජ්‍යය - ........................
x. පරිපාලන - .......................

4) පහත දී ඇති පද විසන්ධි කොට දක්වන්න.

i. කථිකාචාර්ය - ......................
ii. ප්‍රධානාචාර්ය - .....................
iii. ශාස්ත්‍රාලය - .......................
iv. ශිෂ්‍යාධාර - .........................
v. උත්කෘෂ්ටාලංකාර - .............
vi. ප්‍රාචාර්ය - ............................
vii. විවිධාංග - ..........................
viii. චරිතාපදානය - ...................
ix. ගමනාගමන - ......................
x. ගෞරවාදරය - .....................

5) පහත දී ඇති වචන යොදා අර්ථවත් වාක්‍ය සකසන්න.

i. පුරෝගාමීත්වය - ..................................................................................
ii. ප්‍රජාතන්ත්‍රවාදී - ..................................................................................
iii. මෙහෙවර - ..................................................................................
iv. අනුබද්ධිත - ..................................................................................
v. ස්වාධීන - ..................................................................................
vi. ප්‍රතිපාදන - ..................................................................................
vii. ප්‍රසාරණය - ..................................................................................
viii. පරිවර්තනය - ..................................................................................
ix. අන්තර්ජාතික - ..................................................................................
x. ප්‍රතිපත්තිගරුක - ..................................................................................

6) අයිවර් ජෙනිංග්ස් මහතාගෙන් සිදු වූ ශාස්ත්‍රීය මෙහෙවර යන මැයෙන් රචනයක් ලියන්න.

# ඒකකය - විභක්ති

**ගුරුභවතාගේ නම : එච්.එස්.බී.උදය කුමාර (077 4222595) - අම්/ හිමිදුරාව විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 11

**11 ශ්‍රේණියේ සිංහල පෙළ පොතෙහි 11 වන පාඩම 'විභක්ති' පිටු අංක 90 සිට 99 දක්වා අධ්‍යයනය කර මෙම කාර්ය පත්‍රිකාව කරන්න.**
**→ නාම ප්‍රකෘතියකට විභක්ති ප්‍රත්‍ය එකතුවීමෙන් විවිධ අර්ථවල නාමපද යෙදේ.**

01). ප්‍රථමා විභක්තිය

1. ඕනෑම වාක්‍යයක කර්තෘ සිටින්නේ කුමන විභක්තියෙන් ද? ................

- පහත සඳහන් වාක්‍යවල ප්‍රථමා විභක්ති පද තෝරන්න.

1. ලෝකයේ අනාගතය පිළිබඳ ව ඔවුහු විවිධ මත පළකළහ.
2. තරුණයන් විප්ලව කරද්දී පාලකයෝ නිහඬව සිටිති.
3. ඔහුත් ඇයත් අනාගතය වෙනුවෙන් නිවැරදි තීරණයක් ගත් හ.
4. ගුරුවරුන් විසින් සිසුහු සුමගට යොමුකරනු ලබති.
5. නළුනිළියන් විසින් ප්‍රේක්ෂකයෝ පිනවනු ලබති.

02). කර්ම විභක්තිය

කර්ම විභක්තිය වාක්‍යයක යෙදෙන්නේ කුමන ආකාරයෙන් ද? .......

- පහත සඳහන් වාක්‍යවල කර්ම විභක්ති පද තෝරන්න.

1. ගුරුවරු සියලු සිසුන් දැනුවත් කළහ.
2. වනසතුන්ගෙන් රැකගැනීමට ඔහු හේනෙහි වැට බැන්දේ ය.
3. ඔවුහු මිතුරන් සමඟ කටයුතු කළහ.
4. දෙමාපියෝ දරුවන් එනතුරු බලා සිටිති.
5. කොකෙක් මත්සයෙකු ඩැහැ ගත්තේ ය.

03). කර්තෘ විභක්තිය

**කර්තෘ විභක්තිය කර්මකාරක වාක්‍යවල අනුක්ත කර්තෘ ලෙස "විසින්" නිපාතය සමඟ යෙදේ.**

- පහත සඳහන් නාමපද කර්තෘ විභක්තියෙහි යොදන්න.

| | | |
|---|---|---|
| 1. මිනිසා ................................ | 2. ගැමියා .......................... | 3. තරුණයෙක් .............. |
| 4. දෙමාපියෝ............................ | 5. ගැමියෝ ......................... | 6. කාන්තාවක් .............. |
| 7. ඔවුහු ................................ | 8. නිවේදිකාවක් .................. | 9. ගොවියෙක් .............. |

04). කරණ විභක්තිය

**කර්තෘගේ ක්‍රියාවට උපකාරී වන පදය කරණ විභක්තියෙන් යෙදේ. මෙහි ඇති කරණ විභක්ති පද තෝරන්න.**

1. ඔහු පින්සලෙන් චිත්‍රය පාට කළේ ය.
2. ගොවියෝ උදලුවලින් බිම සකස් කළහ.
3. අක්කා පනාවෙන් හිස පීරුවාය.
4. අපි පොත පතින් දැනුම ලබමු.
5. ශිෂ්‍යයෝ ඉදල්වලින් පාසල් මිදුල පිරිසිදු කළහ.

05). සම්ප්‍රදාන විභක්තිය

යමක් ලබන්නා හඟවන පදය සම්ප්‍රදාන විභක්තිය ගනියි. සම්ප්‍රදාන විභක්තියේද ලබන්නා හැඟවීමට 'ට/වලට' විභක්ති ප්‍රත්‍ය යෙදෙන අතර ඊට අමතරව "වස් / පිණිස , උදෙසා,සඳහා " නිපාත පද යෙදේ. පහත සඳහන් වාක්‍යවල සම්ප්‍රදාන විභක්ති පද තෝරන්න.

1. විදුහල්පතිතුමා සිසුන්ට අවවාද දෙයි.
2. ගොවියෝ කුඹුරු වලට පොහොර යොදති.
3. දෙමාපියෝ දරුවන්ට අවවාද දෙති.
4. රණවිරුවන් උදෙසා ඔවුහු බෝධි පූජා කළහ.
5. අසරණයන් සඳහා ශිෂ්‍යයෝ දන්සල් දුන්හ.

06). අවධි විභක්තිය ( වෙන්වීමේ ,පහවීමේ සීමාව හඟවන පදය )

පහත සඳහන් වාක්‍යවල අවධි විභක්ති පද තෝරන්න.

1. නළුනිළියෝ වේදිකාවෙන් බැස ප්‍රේක්ෂකයන් අතරට යති.
2. ශිෂ්‍යයෝ පාසල නිමවී ගේට්ටුවෙන් පිටව යති.
3. කුරුල්ලා කූඩුවෙන් පියඹා ගියේ ය.
4. ඔවුහු රැකියා සොයා රටින් පිටවෙති.
5. අහසෙන් වැටෙන එක දිය බිඳක්වත් අපතේ නොහරින්න.

07). සම්බන්ධ විභක්තිය - අයිතිය හඟවන පදය 'ගේ' විභක්ති ප්‍රත්‍ය යෙදේ.

1. දරුවන්ගේ අනාගතය අධ්‍යාපනය මත රඳා පවතියි.
2. අවුරුදු සමය තුළ කොවුලාගේ කටහඬ ඈතට ඇසෙයි.
3. බුද්ධිමතුන්ගේ අදහස් රටට අවශ්‍යම කාලයයි.
4. ජනකවියෙන් ගැල්කරුවාගේ දුක ප්‍රකාශ වෙයි.
5. බෞද්ධයෝ බුදුන්ගේ ගුණ සිහිපත් කරති.
6. මැටිල්ඩාගේ දියමන්ති මාලය ලොයිසල්ගේ කටුක දිවියට මග පාදයි.

08). ආධාර විභක්තිය -

යමක් දරා ගැනීමක් , ආධාරවීමක් හඟවන පදය (හි/වල/කෙරෙහි) විභක්ති ප්‍රත්‍ය යෙදේ.

1. කුඩා දරුවෝ මුහුදු වෙරළෙහි සෙල්ලම් කරති.
2. ඔවුහු පුටුවල පමණක් නොව ගස් සෙවණෙහි ද අධ්‍යාපනය ලබති.
3. දරුවා තොටිල්ලේ සුවසේ නිදයි.
4. මානව සමාජය කුඩා දරුවන් කෙරෙහි මීට වඩා අවධානය යොමු කළ යුතුයි.
5. විශාල ගස්වල කුරුල්ලෝ කූඩු සාදති.

09). ආලපන විභක්තිය ( ආමන්ත්‍රණය කරන පදය)

පහත සඳහන් වාක්‍යවල ආලපන විභක්ති පද තෝරන්න.

1. අහන්න මගෙ හොඳ පුංචි පුතේ , ඔබේ අතේ මතු අනාගතේ....
2. එන්න මඳ නලේ , ගොස් පවසන්න දුක මගේ...
3. දරුවනි , දැන්වත් ඉගෙන ගනිවු.
4. වනිතාවනි , ඔබට හිමිතැන ඔබම රැකගන්න.
5. විචාරකයිනි , සාහිත්‍යය සැබෑ යථාර්ථය සහෘදයාට කියාදෙන්.

# ඒකකය - බස ඉපදුණු හැටි අසනුය විස්තර

**ගුරුභවතාගේ නම : කේ.ඩී.ඩී.එම්. දිසානායක - අම්/මාන්තොට්ටම මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 12

01. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   1.) භාෂා ශක්‍යතාවය යනු කුමක් ද?
   ..........................................................................................................................................
   2.) උප භාෂාවක් යනු කුමක් ද?
   ..........................................................................................................................................
   3.) මෙහි දැක්වෙන පරිදි භාෂාවේ උපත සම්බන්ධ මතවාද මොනවා ද?
   ..........................................................................................................................................
   4.) භාෂාව හා සංස්කෘතිය අතර පවත්නා අවියෝජනීය සම්බන්ධතාවය කුමක් ද?
   ..........................................................................................................................................
   5.) විමල් ජී.බලගල්ලේ මහතාට අනුව මූල භාෂා සංකල්පය බිහි වූයේ කුමන කරුණක් පදනම් කොට ගෙන ද?
   ..........................................................................................................................................


02. පහත පද වල අරුත් පැහැදිලි කරන්න.
   1.) පරිණාමවාදය ..........................................................................................................
   2.) අවියෝජනීය ..........................................................................................................
   3.) වාහකයා ..........................................................................................................
   4.) පුනරුත්පත්තිය..........................................................................................................
   5.) සංස්කෘතික..........................................................................................................
   6.) ජයග්‍රහණය..........................................................................................................
   7.) ශීර්ෂ කපාලය..........................................................................................................
   8.) භාෂා උපාර්ජනය..........................................................................................................

03. පහත ඡේදය හොඳින් කියවා අදහස් සාරාංශ කොට ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

සෑම පුද්ගලයෙකු තුළ ම කලා නිර්මාණයකින් නිරූපිත ජීවන තතු,සමාජ තතු දැකිය හැකිය. අවබෝධ කර ගත හැකිය.එහෙත් එහි නිර්මාපකයා දැකිය නොහැකි ය. නිර්මාණයන්ගේ පසුබිම දැකිය නොහැකි ය. මේ අදහස් සාමාන්‍යයෙන් පිළිගන්නා නමුදු ඒවා එතරම් ම නිරවද්‍ය නොවේ. නිර්මාණයන්ගෙන් නිර්මාපකයා දැකිය හැකිය. එහි අර්ථය ඒ පුද්ගලයාගේ ස්වභාවය දැකීම නොවේ. ඇතැම් විට කෘතියකට වඩාත් සමීප වූ විට කෘතියේ නිර්මාපකයාගේ හැඩරුව, රුව ගුණ පවා දැකීමට පුළුවන. මෙය අර්ථ සම්පන්න ක්‍රියාවක් ලෙස කෙනෙකුට පෙනෙනු ඇත. සැබැවින් ම මෙය භාවාත්මක ක්‍රියාවක් විය හැකි ය. තතු එසේ වුවත් ඉන් අනාවරණය වන එක් වැදගත් දෙයක් ඇත.එනම් නිර්මාණය මෙන් ම නිර්මාපකයා පාඨකයාගේ ජීවිතයට කොතරම් ඈඩි ව සම්බන්ධ වන්නේ ද යන්නයි.ඒ ඈඩි සම්බන්ධය නිසා පාඨකයා පරිකල්පනයෙන් බොහෝ දේ දකී.

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

05) .රාජකාරී ලිපියක ඇතුළත් විය යුතු මෙම අංග පහත ආකෘතියෙහි අනුපිළිවෙළින් දක්වන්න.
(දිනය,ආමන්ත්‍රණය, ,මාතෘකාව,ලබන්නාගේ ලිපිනය,යවන්නාගේ අත්සන,යවන්නාගේ ලිපිනය,අන්තර්ගතය.)



- පවුල් 100ක් පමණ ජීවත් වන ඔබ ප්‍රදේශයේ ජනතාවට දිගු කලක සිට පානීය ජල අර්බුදයකට මුහුණ පෑමට සිදුව ඇත.මේ සඳහා විසඳුමක් වශයෙන් ප්‍රජා ජල ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණ ද මේ වන විට එය අතරමග නවතා දමා මාස ගණනාවකි.එබැවින් මෙම ව්‍යාපෘතිය ඉක්මනින් අවසන් කර මෙම ගැටලුවට විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශික ජල සැපයුම් කළමනාකාරතුමා වෙත යවන ලිපිය ලියන්න.ඔබ අදාළ ව්‍යාපෘතිය හා සම්බන්ධ ස්වේච්ඡා සංවිධානයේ ලේකම්වරයා බව සිතන්න. .(වචන 100 ක් පමණ ප්‍රමාණවත් වේ.)

- පොළොන්නරුව සඳගිරිගම ප්‍රදේශයේ පසුගිය දිනවල ඇදහැලුණු ධාරාණිපාත වර්ෂාව හේතුවෙන් ඩෙංගු රෝගය පැතිර යාමේ අවධානමක් ගොඩනැගී ඇත.මේ තත්වය හමුවේ ප්‍රදේශයේ මහජනතාවගේ ලේ පරීක්ෂා කිරීමේ වැඩසටහනක් හා ඩෙංගු රෝගය වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අන්දම පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කරන ලෙස ඉල්ලා මහජන පරීක්ෂකතුමා වෙත යවන ලිපිය ලියන්න.ඔබ සඳගිරිගම එකමුතු සමාජයේ ලේකම් නිශ්ශංක පෙරේරා යැයි සිතන්න.(වචන 100 ක් පමණ ප්‍රමාණවත් වේ.)

- මීරිගම මහා විද්‍යාලයේ සිසුන් අතර දන්ත රෝග බහුලව පැතිර යමින් පවතින බව පෙනේ.ඊට ප්‍රධාන හේතුව වී ඇත්තේ මුඛ සෞඛ්‍යය පිළිබඳ ඔවුන්ගේ නොදැනුවත්කමයි.මේ පිළිබඳව දැනුවත් කෙරෙන දන්ත සායනයක් පැවැත්වීමට අවශ්‍යය පියවර ගන්නා ලෙස ඉල්ලමින් ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට යවන ලිපියක් සකස් කරන්න. පාසල් සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න.(වචන 100ක් පමණ ප්‍රමාණවත් වේ.)

# ඒකකය - බහු විධ මාධ්‍ය භාවිතය

එච්.ඩබ්.තමරා නිල්මිණි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්පාර

කාර්ය පත්‍රිකා අංක 13

1) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. මිනිසාගේ මූලික සන්නිවේදන ක්‍රමය .................................... යි.

ii. යම් කිසි ඉදිරිපත් කිරීමක් ........................................................ කරගැනීම බහුවිධ මාධ්‍යය වැදගත් වේ.

iii. සිංහල අක්ෂර .................................. යන නමින් ද හඳුන්වයි.

iv. වර්තමානයේ වඩාත් ප්‍රචලිත ඉදිරිපත් කිරීමේ උපාංගය ........................................... ......................................... වේ.

v. බහුවිධ මාධ්‍ය භාවිතයෙන් ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කරන්නාගේ .......................... වැදගත් වේ.

(වර්ණ , විචිත්‍රවත් , කථන ශෛලිය , බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය , කථනය)

2) ඉදිරිපත් කිරීමක් සඳහා යොදා ගත හැකි බහුවිධ මාධ්‍ය නම් කරන්න.

- ..............................................................................................................
- ..............................................................................................................
- ..............................................................................................................
- ..............................................................................................................
- ..............................................................................................................

3) තිරු ලිපියක් හා කතු වැකියක් අතර ඇති වෙනස්කම් සංසන්දනාත්මකව ඉදිරිපත් කරන්න.

| තිරු ලිපිය | කතු වැකිය |
|---|---|
| | |

4) පහත දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. මෙම පාඩමට දායක කොටගෙන ඇත්තේ කවර ස්ථානයක කුමන අවස්ථාවක් ද?

.......................................................................................................

ii. සිංහල සංගමයේ සභාපති හා ලේකම්ගේ නම් ලියන්න.

.......................................................................................................

.......................................................................................................

iii. එදින ඉදිරිපත් කළ වැඩසටහන අනුපිළිවෙළින් පෙළ ගස්වන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

iv. උත්සවයේ ප්‍රධාන ආරාධිතයා හා ප්‍රධාන දේශකයා නම් කරන්න.

.......................................................................................................

.......................................................................................................

v. උත්සවයේ සමාප්තිය සටහන් කෙරුණේ කෙලෙසද?

.......................................................................................................

.......................................................................................................

vi. පාඩමේ ඇති කතුවැකිය උපුටා ගත්තේ කවර සඟරාවකින් ද?

.......................................................................................................

vii. 'රයිගම් රාළ' හා 'උකුස්සා' තීරු ලිපි සම්පාදනය කළේ කවරෙක් ද?

.......................................................................................................

viii. චන්ද්‍රරත්න මානවසිංහ මහතාගේ ප්‍රකට තීරු ලිපි සංග්‍රහය නම් කරන්න.

.......................................................................................................

5) 'ජංගම දුරකථන භාවිතය හා තරුණ පරපුර' යන මාතෘකාව යටතේ තීරු ලිපියක් සකස් කරන්න.

6) පිටු පෙරළනයක් ආශ්‍රයෙන් සිංහල අක්ෂර මාලාව පිළිබඳ ඉදිරිපත් කිරීමක් කිරීමට ඔබට අවස්ථාව ලැබුණේ නම් ඔබ විසින් පිටු පෙරළනයේ එක් එක් පිටුවට ඇතුළත් කරන කරුණු අනුපිළිවෙළින් දක්වන්න.

# ඒකකය - රට වටා පද රටා

එච්.ඩබ්.තමරා නිල්මිණි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්පාර

## කාර්ය පත්‍රිකා අංක 14

1) පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

i. භාෂාව සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

a) භාෂාව මානව සංස්කෘතියේ පදනමයි.
b) භාෂා ශක්‍යතාව නිසා මිනිසා විශිෂ්ටයෙකු වී ඇත.
c) භාෂා විභවතාව මගින් මිනිසා ජීව හා ද්‍රව්‍ය ලෝක පාලනය කරයි.
d) ඉහත ප්‍රකාශ සියල්ල ම වැරදි ය.

ii. වර්තමාන උපභාෂාමය ව්‍යවහාර භාවිතයෙන් ඈත්වීමට හේතු වී ඇත්තේ,

a) බහුජන සන්නිවේදන මාධ්‍යය ව්‍යාප්තිය
b) සම්මත ව්‍යවහාර ප්‍රචලිත වීම
c) සමාන අධ්‍යාපන අවස්ථා හිමි වීම
d) ඉහත කරුණු සියල්ල ම

iii. ප්‍රාදේශික උප භාෂා කලාපයක් නොවන්නේ,

a) කොළඹ
b) රුහුණ
c) දිගාමඩුල්ල
d) නුවරකලාවිය

iv. පරිමිත භාෂාවලට අයත් නොවන්නේ,

a) විවිධ වෘත්තීන්
b) විවිධ සමාජ කණ්ඩායම්
c) උඩරට ජනවහර
d) අභිචාරමය අවස්ථා

v. රුහුණු උපභාෂාවට අයත් නොවන වචනය වන්නේ,

a) සුමක්කරය
b) ඔයනවා
c) කායම
d) කරිජ්ජ

vi. සත් කෝරළේ උපභාෂාවේ භාවිතා වන වචනයක් වන්නේ,

a) පරියා
b) පහිනය
c) හින්නා
d) පතහ

vii. ප්‍රාදේශික උපභාෂා සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

a) දිගාමඩුලු - විසාදිය - රෝග වැළඳීම
b) සබරගමු - පැලපදියම් වීම - පදිංචි වීම
c) උඩරට - ඇඹරයා - කුඹියා
d) නුවර කලාවිය - පැල් ගැහීම - විවාහ වීම

viii. කමත් භාෂාවේ නොයෙදෙන වචනය ,

a) දියදොස්
b) යතුර
c) මුදුනා
d) මාගල

ix. ධීවර භාෂාව ආශ්‍රිතව භාවිත නොවන වචනය තෝරන්න.

a) ජම්පර කළුව - වැහි කබාය

b) මායියා - බිරිඳ

c) පන්න කරනවා - මසුන් මැරීම

d) ජාලය - දැල

x. පරිමිත භාෂා අතර වැරදි යෙදුම තෝරන්න.

a) පතල් භාෂාව - නම්බුව

b) ශ්‍රී පාද වන්දනාව - සුමක්කරය

c) හේන් - සකලයෝ

d) ධීවර - හැන්නදිරාල

2) පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| පොදු ජනවහර | උපභාෂා වහර | උපභාෂා කලාපය |
|---|---|---|
| i. හිමිදිරිය | කළු කපා එළිය | රුහුණ |
| ii. ................................ | කෝලම්කාරයා | ........................................ |
| iii. නළවනවා | ................................. | ........................................ |
| iv. ................................ | පුක්කා | දිගාමඩුල්ල |
| v. පිරිමි ළමයා | ................................. | ........................................ |
| vi. ................................ | ගඟුල බානවා | ........................................ |
| vii. විවාහ වීම | ................................. | නුවර කලාවිය |
| viii. ................................ | කරිජ්ජ | ........................................ |
| ix. රෝග වැලඳීම | ................................. | ........................................ |
| x. ................................ | වයිතාලය | ........................................ |

3) පරිමිත භාෂා ව්‍යවහාර ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පොදු වහර | පරිමිත භාෂාවහර | පරිමිත භාෂාව |
|---|---|---|
| i. ................................ | ඇඳුත්ත | කමත් භාෂාව |
| ii. කුල්ල | ........................................ | ........................................ |
| iii. මසුන් මැරීම | ........................................ | ........................................ |
| iv. ................................ | ජම්පර කළුව | ........................................ |
| v. ................................ | කුරුලු පාළුව | ........................................ |
| vi. අඳුර වැටෙන වෙලාව | ........................................ | ........................................ |
| vii. නොවටිනා ගල් | ........................................ | ........................................ |
| viii. ................................ | ඉල්ලම | ........................................ |
| ix. ................................ | දෙයියන්නෙ රට | ........................................ |
| x. වන්දනා කණ්ඩායම | ........................................ | ........................................ |

# ඒකකය - සමාස

**ගුරුභවතාගේ නම : ආර්.එම්. නිලූකා රණසිංහ - අම්/කාවන්තිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 15

01. පහත රවුම තුළ දී ඇති සමාස පද දී ඇති සමාස වර්ගය ඉදිරියෙන් ලියන්න.

අනලස්, රන්රිදී, කිරිබත්, දිගැසි,

දසබල, මුනිපුද, මුතුදත්,දිගු වරල,මලව්,

මද සුළඟ, වැසි ජලය, රටවැසි, දුසිරිත්,

තුන්බිය, පරපුටු, දරු දැරියෝ,

අනෞචිත්‍ය, මුව තඹර, තාරපති,

තිනෙත්, ද

1. අව්‍යය සමාස - ......................................................
2. විභක්ති සමාස - ......................................................
3. විශේෂණ සමාස - ......................................................
4. අන්‍යාර්ථ සමාස - ......................................................
5. ද්වන්ද්වාර්ථ සමාස - ......................................................

02. පහත සඳහන් වාක්‍යවල ඇති සමාස පද තෝරා ලියන්න.

I ගම්වැසියෝ රන් අභාරණ රැගෙන වනයට දිවූහ.

II මහ වර්ෂාවෙන් ඇළ දොළ ගංඟා පිටාර ගැලුවේය.

III දිගු වරල පීරා සුදුමල් වට්ටියක් අතැතිව දරු දැරියෝ පන්සලට පියනගති.

IV අකුසල්වලින් වැළකී දසරාජධර්මයට අනුව රට පාලනය කළහොත් තුන්බියෙන් රට ආරක්ෂා කරගත හැකිය.

V කෘෂිහානි වළකා ගැනීමට ගම්වැසියෝ නොයෙක් පියවර ගත්හ.

VI ළමා පොත් කියවන්නට දරු දැරියෝ බෙහෙවින් ප්‍රිය කළහ.

VII රන් රිදී ආභරණ පළඳාගෙන රජ බිසව ගල් පඩියෙන් බිමට බැස්සාය.

VIII කිරි දත් පෙන්නා සිනාසුන බිළිඳිය දෙස මව ආදරයෙන් බැලුවාය.

IX දසබලධාරි අප තථාගතයන්ගේ පා පියුම් පුදන්නට මම වනමල් නෙලාගත්තමි.

03. පහත සඳහන් ඡේදයේ ඇති සමාස පද නිවැරදිව සකසා එම ඡේදය නැවත ලියන්න.

පියුමක් වැනි පාද ඇති අප තිලොවට අග්‍ර වූ බුදු හිමි වැඩ සිටින විහාරය ඈතින් දිස්වන විට සිතට ඇති වන්නේ පුදුමාකාර සැනසිල්ලකි. දුක ද සැප ද සම සමව විද දරාගෙන ජීවත් වන ගමෙහි වසන වැසියෝ වැස්සෙන් ලැබෙන ජලයෙන් සිය කුඹුරු අස්වනු සරු කර ගනිති. මවගේ කිරි උරා බී නිල් පැහැති තණකොළ මත දිවයන වසු පැටියා දෙස දරුවෝ ද දැරියෝ ද බලා සිටිති. සරත් කාලයෙහි සඳ මෝදුවන රැයේ මුනිඳුට කරන පුද සත්කාර දෙස බලමින් මුතු වැනි දත් දෙපළ විහිදා දිගු වරලසින් හැඩ වූ තරුණියෝ සාදුකාර දුන්හ. ඉර ද හඳ ද තරු ද පවතින තුරු දුක ද සැප ද එක සේ විඳ දරා ගැනීමට රටෙහි වැසියෝ පුරුදු වී සිටිති.කුරුල්ලන්ගේ ගී අසමින් කැලෑවෙහි මල් නැළවෙද්දී හිරුගේ රශ්මියෙන් තුරු ලතා ද ජීවය ලබයි.

04. පහත දැක්වෙන පද සමාස කොට ලියා ඒවා කුමන සමාසයට අයත් දැයි ලියන්න.

I මලෙහි පැණි
II කුකවියා
III ගල් වැනි හිත්
IV තරුණියෝ ද තරුණයෝ ද
V රජුගේ නියෝග
VI සතුන්ට දක්වන කරුණාව
VII ශ්‍රී ලංකාවේ වැසියෝ
VIII මල් අවි දරන්නේ
IX දෙවියන් විසින් කියන ලද
X මුනිඳුට කරන පුද

# ඒකකය - ශෝකයත් රසයක් කළ මිනිසෙක්

**ගුරුභවතාගේ නම : ආර්.එම්. නිලූකා රණසිංහ - අම්/කාවන්තිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 16

01. විලියම් ශේක්ස්පියර්ගේ තොරතුරු ඇසුරෙන් පහත ආකෘති පත්‍රය පුරවන්න.

නම - ..............................................................................................

උපන්දිනය - ..............................................................................................

පියාගේ නම - ..............................................................................................

මවගේ නම - ..............................................................................................

උපන් ස්ථානය - ..............................................................................................

පාසලේ නම - ..............................................................................................

බිරිඳගේ නම - ..............................................................................................

ඔහු විසින් කළ නිර්මාණ කාව්‍ය/නාට්‍ය - ..............................................................................................

..............................................................................................

රාජ්‍ය අනුග්‍රහය ලද නාට්‍ය - ..............................................................................................

..............................................................................................

සිය පවුල උදෙසා තැනූ මන්දිරයේ නම - ..............................................................................................

මිය ගිය දිනය - ........................................................

02. ශේක්ස්පියර්ගේ නාට්‍ය කෘතින්ට මූලාශ්‍ර වූ ඉතිහාස කතා හා ජනප්‍රවාද නිසා එම නිර්මාණ තුළ දැකිය හැකි වූ සුවිශේෂී ගුණාංගය කුමක්ද?

03. ශේක්ස්පියර්ගේ නිර්මාණ ජීවිතයේ පරිණතභාවය පළ කෙරෙන තුන්වැනි අවධියට අයත් කෘති මොනවාද?

04. අන් බොහෝ කවියන්ගේ නිර්මාණයන්හි නොදක්නා ලැබෙන විශේෂත්වයන් මොහුගේ කවි වල දැකිය හැකිය. ඒ මොනවාද?

05. "දිලිසෙන සියල්ල රත්තරන් නොවේ" යන සුප්‍රකට පිරුළ වහරයට පැමිණීමට හේතු වූ නාට්‍ය කුමක්ද?

06. ශේක්ස්පියර් නම් වූ අපූරු මිනිසා සතු වූ ජීවිතය පිළිබඳ වූ ගැඹුරු ජීවන දර්ශනය පිළිබඳ පාඩම ඇසුරෙන් හා වෙනත් පොත පත ඇසුරෙන් සොයා ගත් කරුණු ගොනු කර බිත්ති පුවත්පතකට නිර්මාණයක් ලියන්න.

07. පහත සඳහන් වචන වල අර්ථය පැහැදිලි කරන්න.

I තුදුස් -
II ප්‍රතිභාව -
III සුඛාන්ත -
IV පිරිසිඳ -
V පරිපූර්ණ -
VI නෘත්‍යශාලා -
VII දෘශ්‍ය කාව්‍යය -
VIII ජන්මලාභය -
IX සියවස -
X විස්මය ජනක -
XI වනෝද්‍යානය -

08. පහත දැක්වෙන වචනවලට විරුද්ධාර්ථ දෙන වචන ලියන්න.

I මුද්‍රිත -
II විවාද -
III ග්‍රාමීය -
IV බාල විය -
V කීර්තිය -
VI ප්‍රමාණ -
VII සරල -
VIII විරල -
IX ප්‍රචලිත -

09. පහත සඳහන් පද වල ඇති උපසර්ග වෙන්කරන්න.

I සුමිතුරු -
II නිර්මාණ -
III සම්බන්දයෙන් -
IV ප්‍රමුඛ -
V අපූර්ව -

08. පහත සඳහන් ජේදයේ ඇති වචන 1/3 වන සේ සාරාංශ කරන්න.

දහඅට වැනි සියවස තෙක් ම විලියම් ශේක්ස්පියර් සලකන ලද්දේ අප්‍රමාණ ප්‍රතිභාවෙන් යුක්ත වුව ද නිසි ලෙස අධ්‍යාපනය නොලද ගොරහැඩි නිර්මාණකරුවෙකු හැටියට ය. ශේක්ස්පියර්ගේ නමින් ප්‍රචලිත නිර්මාණ එවකට රාජ්‍ය පාලකයකු හා දාර්ශනිකයෙකුව සිටි ශ්‍රීමත් ෆ්‍රැන්සිස් බේකන් හෝ සදම්ස්ටන්හි ආදිපාදවරයා හෝ කරන්නට ඇතැයි ද මතයක් ගොඩනැගී තිබිණි.කෙසේ වුව ද ශේක්ස්පියර් නිර්මාණ කෙරෙහි සාහිත්‍ය ලෝකයේ අවධානය වැඩි වශයෙන් යොමු වන්නට වූයේ දහනව වන සියවසෙන් පසුව ය. මේ අපූරු මිනිසා සතු වූ ජීවිතය පිළිබඳ ගැඹුරු තියුණු දැනුමත් ලෝක ස්වභාවය පිළිසිඳ දැකීමෙන් පළ කරන ලද ජීවන දර්ශනයත් එතැන් සිට නිසි විමසුමට ලක් වන්නට විය. එහි ප්‍රතිඵලයක් හැටියට ලෝකය හමුවේ අනාවරණය වූයේ කවියකු ද දෘශ්‍ය/කාව්‍ය රචකයකු ද හැටියට ශේක්ස්පියර් සතුව පවත්නා වූ දැවැන්ත ප්‍රතිරූපයයි.

# ඒකකය - ප්‍රත්‍යයාර්ථ නාම

**ගුරුභවතාගේ නම : යූ.ඩබ්.ධනසීලි - අම්/කාවන්තිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 17

- ප්‍රත්‍යයාර්ථ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
  1. ප්‍රත්‍යයාර්ථ නාම කොටස් කීයකට බෙදේ ද?.........................................................
  2. ඒ කොටස් නම් කරන්න. ..............................................................................
  3. තද්ධිත නාම පද සාදා ගන්නා අයුරු විස්තර කරන්න.
     ..............................................................................................

**04. පහත සඳහන් එක් එක් අදහස සඳහා සුදුසු තද්ධිත නාම පදය බැගින් ලියන්න.**

I. තොටෙහි නියුතු වූයේ - ............................................................
II. දැවයෙන් කරන ලද - ............................................................
III. නුවණ ඇත්තේ - ............................................................
IV. දිරිය ඇත්තේ - ............................................................
V. පෙර කාලයට අයත් - ............................................................
VI. සිසිල ම - ............................................................
VII. දෙදෙනෙකු අතරින් - ............................................................
VIII. තන්තු ස්වභාවය ඇති - ............................................................
IX. සියල්ල අතරින් මිහිරි - ............................................................

**05. පහත සඳහන් තද්ධිත නාම පදවල ප්‍රත්‍යය වෙන්කර ලියන්න.**

උදා-:පෞද්ගලික - පුද්ගල +ඉක

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | පළිඟුමය | - .......................... | VI. | ළැදියා | - .......................... |
| II. | ඉඟටි | - .......................... | VII. | ජනතා | - .......................... |
| III. | පොඩිති | -.......................... | VIII. | ස්වදේශීය | - .......................... |
| IV. | ඉසුරුමත් | - .......................... | IX. | සෞන්දර්ය | - .......................... |
| V. | පාපතර | - .......................... | X. | ප්‍රවීණත්ව | - .......................... |

**06. පහත තද්ධිත පද යොදා වාක්‍ය සකස් කරන්න.**

I. රූමත් -..............................................................................................
II. ගැමියා -..............................................................................................
III. ව්‍යාපාරික -..............................................................................................
IV. පුතණුවෝ -..............................................................................................
V. කාර්යාලයීය-..............................................................................................

**07. පහත සඳහන් වාක්‍යවල ඇති තද්ධිත පද යටින් ඉරි අඳින්න.**

I. ඔහු කළවි පොල් කඩයි.
II. ගැමියා මූලික අයිතිවාසිකම් කඩ වන බව පැවසුවේ ය.
III. පියාණෝ පුතණුවන්ට ඔවදන් දුන්හ.
IV. අක්කා නංගිගේ උපන්දිනයට මල් කිනිත්තක් දී සුබ පැතුවා ය.
V. තොටියා තොටුපළ වෙත ළඟා වූයේ ය.
VI. පාපිෂ්ඨ මිනිසා අරටු ඇති ගස් සොයා වනයේ සැරිසරයි.
VII. රූමත් නිළිය ඉඟටිය ලෙළවා වේදිකාවේ ගමන් කරයි.
VIII. මේ දිනවල පැතිරෙන වසංගත රෝගය නිසා බුද්ධිමත් ජනතාවෝ දුර්වලතා මග හරිමින් කටයුතු කරති.

- කෘදන්ත නාම

01.කෘදන්ත නාම පදයන් සකස් කරන්නේ කෙසේ ද?

..........................................................................................................................

02.පහත සඳහන් ධාතු ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එකතු කර කෘදන්ත නාම පද සකස් කර ලියන්න.

..........................................................................................................................

| ධාතු ප්‍රකෘතිය | | ප්‍රත්‍යය | කෘදන්ත නාම පද |
|---|---|---|---|
| නට | + | න | .............................. |
| ලිය | + | නු | .............................. |
| ගය | + | උම් | .............................. |
| හඬ | + | ඊම් | .............................. |
| නට | + | ඉලි | .............................. |
| සිඟ | + | මන් | .............................. |
| හඬ | + | උණු | .............................. |
| බල | + | එ + නු | .............................. |
| ගය | + | එ + න | .............................. |
| රක් | + | ඉ + න +ඕ | .............................. |

03. පහත සඳහන් කෘදන්ත නාම පද යොදා වාක්‍ය සාදන්න.

I. ගැයුම - ..........................................................................................
II. ලියන - ..........................................................................................
III. සිඟමන් - ..........................................................................................
IV. රකෙන - ..........................................................................................
V. දුවන්නෝ - ..........................................................................................

04. පහත සඳහන් වාක්‍යවල කෘදන්ත පද තෝරා යටින් ඉරි ඇඳ ප්‍රත්‍යය වෙන් කොට ලියන්න.

I. ළමයා හොඳින් පිළිතුරු ලියනු පෙනේ -.................................................
II. පෙරහැරේ ලී කෙළි නැටුම ඉදිරිපත් කළේ පාසල්වලිනි -...................................
III. විශේෂාංග ලිපියේ කැපිලි කෙටිලි නිම කර මුද්‍රණයට යැවිණි -.............................
IV. ධාවන පථයේ වේගයෙන් දුවන දරුවන්ට ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ-...........
V. කුඹුරු යායේ ගොයම් කැපීම කරනු ලබන්නේ ගමේ තරුණ තරුණියෝ ය-..........

05. නිවැරදි පිළිතුර තෝරන්න.

I. අසමින් යන ක්‍රියා පදයේ අස යනු

I ධාතු ප්‍රකෘතියකි ii ප්‍රත්‍යයකි iii නිපාතයකි iv විශේෂණ පදයකි

II. ප්‍රසංග + ඉක යන ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වචනය තෝරන්න.

I ප්‍රාසාංගික ii ප්‍රසංගික iii ප්‍රාසංගික iv ප්‍රසාංගික

III. සමාජ + ඊය යන ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය එක් වූ විට සෑදෙන නිවැරදි පිළිතුර කුමක්ද?

I සමාජීය ii සමාජීය iii සමාජයීය iv සාමාජයීය

IV. පහත දක්වා ඇති පද අයත් වන ව්‍යාකරණ වර්ගය කුමක්ද?
කැහැටු ,කළටි, පහටි

I තද්ධිත ii කෘදන්ත iii නිපාත iv රූඪී

V. හැඩිණි යන පදයේ හඬ යන්න

I ධාතු ප්‍රකෘතියකි ii නාම ප්‍රකෘතියකි iii ප්‍රත්‍යයකි iv විශේෂණ පදයකි

# ඒකකය - මිහිලිය නළලේ අංජන තිලකේ

**ගුරුභවතාගේ නම : යූ.ඩබ්.ධනසීලි - අම්/කාවන්තිස්ස මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 18

➢ **මිහිලිය නළලේ අංජන තිලකේ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01.දේශාභිමානය යනු කුමක් ද?.......................................................................................
.......................................................................................................

02. දේශාභිමානී ගීත යනු කුමක් ද? ..............................................................................
.......................................................................................................

03.අප රටට නිදහස ලැබීමට පෙර දේශාභිමානී හැඟීම් ඉස්මතු කෙරෙමින් නිර්මාණයකරණයේ නියැලුණේ කවුරුන් ද?.............................................................................

04 .නිදහසින් පසු දේශාභිමානී ගීත ලියූ නිර්මාණකරුවෝ කවුරුන් ද?
.......................................................................................................

05.අරිසෙන් අහුබුදු මහතාගේ "ලංකා ලංකා පෙම්බර ලංකා" නිර්මාණයේ දැකිය හැකි විශේෂත්වයන් දෙකක් ලියන්න. .......................................................................
.......................................................................................................

06.කවියා ලංකා මාතාවගේ බඳින ලද කෙහෙ කලාප ලෙස දකින්නේ මොනවා ද?
.......................................................................................................

07. ලංකා ලංකා නිර්මාණයේ සඳහන් පැරණි සිංහල කවීන් දෙදෙනෙකු නම් කරන්න.
.......................................................................................................

08. ලංකා ලංකා ගීතය ගායනා කරන ලද්දේ කා විසින් ද? ...............................................

09. "මිහිලිය නළලේ අංජන තිලකේ" නිර්මාණය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
.......................................................................................................

10. "මිහිලිය නළලේ අංජන තිලකේ"පැදි පෙළෙහි මාතෘ භූමිය හඳින්වීමට යොදා ඇති යෙදුම් දෙකක් සොයා ලියන්න... ..............................................................................

11. "මිහිලිය නළලේ අංජන තිලකේ"පද්‍ය පන්තියේ ශබ්ද රසය ඇති කරන යෙදුම් දෙකක් උපුටා ලියන්න...........................................................................................

12. පහත සඳහන් වචනවල අරුත් ලියන්න.

i. දිවි දී - ..................................................
ii. කිවිසුරු - ..................................................
iii. ලෝ කුඹුව - ..................................................
iv. දන පිනන - ..................................................
v. බුජ බල - ..................................................

13. පහත සඳහන් කොටස් අයත් ව්‍යාකරණ වර්ගය ලියන්න.

i. දිවි දී - ..................................................
ii. කිවිසුරු - ..................................................
iii. කෙත්වතු - ..................................................
iv. සේ - ..................................................
v. සැරසේවා - ..................................................
vi. සුපුන් - ..................................................
vii. සඟ වෙද ගුරු ගොවි- ..................................................
viii. රැකුණොත් - ..................................................
ix. කැල - ..................................................
x. අවහොත් - ..................................................

14. පහත සඳහන් පදවලට සමානාර්ථ පද ලියන්න.

i. දෙරණේ - ..................................................
ii. දන - ..................................................
iii. නිරිඳු - ..................................................
iv. අහස - ..................................................
v. ගස්වැල් - ..................................................
vi. නර - ..................................................
vii. සඳ - ..................................................
viii. ගත - ..................................................
ix. පඩුවන් - ..................................................
x. අත - ..................................................

15. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

i. සරණින් - ..................................................
ii. සලකමු - ..................................................
iii. එන - ..................................................
iv. ගුණෙන් - ..................................................
v. අහසේ - ..................................................

16. පහත සඳහන් යෙදුම්වල අරුත් පැහැදිලි කරන්න.

i. විදු සක්විති මහ පැරකුම් කිවිසුරු කිවියන් ලද
ii. හෙළ මුතු මිණි වැල් එකට දමාලා
iii. අවසන ඔබට මැ පොහොරට මේ කය මෙහි මැ හොවමු

# ඒකකය - බළන්ගොඩින් ගැලූ පැණසර මෙත් ගඟුල

**ගුරුභවතාගේ නම : පී.එම්.පී.ස්වර්ණ ලතා - අම්/බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල**

**කාර්ය පත්‍රිකා අංක 19**

- පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. බළන්ගොඩ නාහිමියන්ගේ මුල්ම නම වන්නේ,

(i) විපුල (ii) විලියම් (iii) පුංචිරාළ (iv) පුංචි මහත්තයා

02. බළන්ගොඩ නාහිමියන් තුළ තිබූ දක්ෂතාවයක් නොවන්නේ,

(i) චිත්‍ර ඇඳීම (ii) ප්‍රතිමා නෙළීම (iii) කැටයම් කලාව (iv) සිලෝ හැදීම බැඳීම

03. බළන්ගොඩ නාහිමියන් කළ සේවාවක් නොවන්නේ,

(i) ධර්ම දූත සේවයේ යෙදීම. (ii) ශික්ෂාකාමී භික්ෂු පරපුරක් බිහි කිරීම.

(iii) ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කරණයේ යෙදීම. (iv) දේශපාලඥයකු වශයෙන් රටට ඉමහත් සේවයක් කිරීම.

04. බළන්ගොඩ නාහිමියන් විසින් දරන ලද තනතුරක් වන්නේ,

(i) දඹදිව මිගදායේ විහාරාධිපති. (ii) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨාධිපති.

(iii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ධූරය. (iv) කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨාධිපති.

05. බළන්ගොඩ නාහිමියන් විසින් ධර්මදූත සේවයේ නොයෙදුණ රටක් වන්නේ,

(i) ඇමරිකාව. (ii) ජර්මනිය (iii) බ්‍රසීලය (iv) ප්‍රංශය

- පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01 බළන්ගොඩ නාහිමියන් මෙලොව එළිය දුටු දිනය කවදා ද? ..............................................

02 උන්වහන්සේගේ දෙමව්පියන් කවුද? ..............................................................................

03 නාහිමියන්ට සසුන් ගත වීම සඳහා බලපෑ ප්‍රධාන සාධකය කුමක් ද? ...................................

04 බළන්ගොඩ නාහිමියන් සසුන් ගතවන දිනය කුමක් ද? ......................................................

05 උන්වහන්සේ විසින් නාලන්දා විශ්වවිද්‍යාලය සඳහා සකස් කරන ලද ආදර්ශ පාඨය කුමක් ද?

..........................................................................................................................

06 බළන්ගොඩ නාහිමියන් පැරැන්නෙකු වුවා මෙන්ම වර්තමානිකයකු ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද?

..........................................................................................................................

07 ධර්ම දූත සේවය සඳහා උන්වහන්සේට මඟ හෙළි පෙහෙළි කර දුන්නේ කවු ද? ..........................

08 බුරුම රාජ්‍යයෙන් උන්වහන්සේට අග්ගමහාපණ්ඩිත උපාධිය හා සම්මාන පිරිනැමීමට හේතුව කුමක් ද?

..........................................................................................................................

09 උන්වහන්සේ විසින් රචනා කරන ලද නවකතාවක් නම් කරන්න ? ..........................................

10 උන්වහන්සේගේ පරාර්ථකාමී බව දැක්වීට මෙහි එන උදාහරණය කුමක් ද? ................................

..................................................................................................................................

- උන් වහන්සේගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ පහක් සඳහන් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

- පහත සඳහන් පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩනගන්න.

(i) භාෂාන්තරඥානය - ..........................................................................................

(ii) නැණ සර - ..........................................................................................

(iii) නෛපුණ්‍යය - ..........................................................................................

(iv) ප්‍රාචීන භාෂා - ..........................................................................................

- එක් එක් පේළියේ මුලින් දැක්වෙන ක්‍රියා වර්ගයට අයත් නොවන පදය තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) විධි ක්‍රියා | - | නවතිනු | වඩිනු | මරනු | පනිති |
| (ii) පූර්ව කියා | - | ගොස් | වපුරා | ලිය ලියා | සෝදා |
| (iii) අසම්භාව්‍ය ක්‍රියා | - | වැටෙද්දී | ගැසුවොත් | බසිත | වැහැරි |
| (iv) ප්‍රයෝජ්‍ය ක්‍රියා | - | නටවයි | කරවයි | නරවුහ | සාදවත් |
| (v) ආශිර්වාද ක්‍රියා | - | පිපෙනු | සැරද | ලැබේවා | වෙත්වා |
| (vi) මිශ්‍ර ක්‍රියා | - | හඬමින් | නටමින් | හඬමින් | කරගෙන |

- "නට" ධාතු ප්‍රකෘතිය ඇසුරින් පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට නිදසුන් සපයන්න.

| ධාතු ප්‍රකෘතිය | විධි ක්‍රියා | අසම්භාව්‍ය ක්‍රියා | ප්‍රයෝජ්‍ය ක්‍රියා | ආශිරවාද ක්‍රියා | මිශ්‍ර ක්‍රියා | පූර්ව ක්‍රියා |
|---|---|---|---|---|---|---|
| "නට" | | | | | | |

# ඒකකය - අද්‍යතන සාහිත්‍ය නිර්මාණයන්හි භාෂාව

**ගුරුභවතාගේ නම : පී.එම්.පී.ස්වර්ණ ලතා - අම්/බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල**

## කාර්ය පත්‍රිකා අංක 20

- පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. භාෂාව යනු,

(i) භාෂාව යනු අදහස් ප්‍රකාශ කිරීමේ මාර්ගයයි.

(ii) භාෂාව යනු හැඟීම් ප්‍රකාශ කිරීමේ මාර්ගයයි.

(iii) මනුෂ්‍යයාගේ අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීමේ මාර්ගය.

(iv) අත්දැකීම් ප්‍රකාශ කිරීමේ මාර්ගය භාෂාව වේ.

02 සිංහලයේ ප්‍රථමයෙන් ලියැවුණු නව ප්‍රබන්ධ කථාව ලෙස සැලකෙන්නේ,

(i) කැලෑ හඳ (ii) වාසනාවන්ත පවුල හා කාලකණ්ණි පවුල (iii) දුප්පතුන් නැති ලෝකය (iv) මීනා

03. "කත්රිනා පංච දැමීම ඉවර කරන්නේ කරාබු උකස් කොට ගන්නා සල්ලි පැරදුණ..." යන සංවාදය අයත් ග්‍රන්ථය වන්නේ

(i) රොසලින් සහ ජයතිස්ස (ii) හෙවනැල්ල (iii) ගම්පෙරළිය (iv) හෙයියම්මාරුව

04. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(i)චරිතයක අභ්‍යන්තර සිතුවිලි දැක්වීමේ දී කටවහර යොදා ගැනීම සිරි ගුණසිංහගේ "හෙවනැල්ල" කෘතිය තුළ දැකගත හැකිය.

(ii) වාසනාවන්ත සහ කාලකණ්ණි පවුල් පොතට පසුව රචනා වූ සිංහල "මීනා" නම් ප්‍රබන්ධය, සාහිත්‍යයේ සන්ධිස්ථානයක් ලෙස සැලකේ.

(iii) සිංහල නවකතාවේ පුරෝගාමියකු ලෙස මාර්ටින් වික්‍රමසිංහ හැඳින්විය හැකිය.

(iv) හෙයියම්මාරුව ගුණදාස අමරසේකරගේ නිර්මාණයකි.

05. පහත සඳහන් ගැළපුම් අතරින් නිවැරදි ගැළපුම කුමක් ද?

(i) කරුමක්කාරයෝ - මාර්ටින් වික්මසිංහ (ii) ගම්පෙරළිය - ගුණදාස අමරසේකර

(iii) හෙයියම්මාරුව - ඒ.වී.සුරවීර (iv) හෙවනැල්ල - අජිත් තිලකසේන

- පහත සඳහන් ග්‍රන්ථයන්හි කතුවරු සඳහන් කරන්න.

(i) කරුමක්කාරයෝ - ................................ (ii) සුන්නද්දූලි - ........................................

(iii) පූජාවලිය - ................................ (iv) හෙයියම්මාරුව - ................................

(v) ගම්පෙරළිය - ................................ (vi) ජයතිස්ස සහ රොසලින් - ........................

(vii) හෙවනැල්ල - ................................ (viii) මීනා - ..........................................

(ix) බුත්සරණ - ................................ (x) වඩබාගින්න - .....................................

- පහත දැක්වෙන වාක්‍යවල අංකිත නිපාත පද කවර අර්ථය පළ කරන්නේ දැයි සඳහන් කරන්න.

(i) "**හැයි** තොප හුන්නේ කොයි ද?" -....................................

(ii) "**මන්ද** කුමාරි සඳ තුළ සළුව උනන්නේ" -....................................

(iii) "අත්තික්කා මල් පිපෙන **තුරු** ඇඟිලි ගණින්නෙමි මං" -....................................

(iv) "නිහඬව සිටින **තාක්** මෝඩයා පණ්ඩිතයෙකි" -....................................

(v) "**හෙම්බා** මහණෙනි මු අකීකරු දැන් මතු නොවෙයි" -....................................

(vi) අපි මුහුදු වෙරළ **දක්වා** ගමන් කරමු. -....................................

(vii) මිනිසා හඳට ගියා **ලු**. -....................................

(viii) මම යහළුවන් **සමඟ** ක්‍රීඩා කරමි. -....................................

(ix) ඔහු ආගන්තුකයෙකු **මෙන්** හැසිරෙයි. -....................................

(x) නංගී**ත්** මමත් පන්සල් යන්නෙමු. -....................................

- පහත සඳහන් නාම මූලයට හෝ ක්‍රියා මූලයට සුදුසු උපසර්ග යොදා නැවත ලියන්න

(i) ජාත -......... (ii) දේශ -............ (iii) ගැඹුර -............ (iv) චර්මය -............ (v) නයන -............

(vi) භෝග -......... (vii) රස -......... (viii) මාන -............ (ix) සිඳු-............ (x) සල -............

- සෑම පේළියක ම යෙදී ඇති නිපාත පදයක් නොවන පදය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (i) | ඉක්බිති | උස | එච් | වනාහි |
| (ii) | නුගුණ | හෙවත් | විසින් | මිස |
| (iii) | සමග | නිරතුරු | දක්වා | හෙමින් |
| (iv) | තකා | කෙනෙකු | තාක | පිණිස |
| (v) | විමසා | සදා | සහ | එම්බා |

- පහත සඳහන් ඡේදයේ ඇති නිපාත පද හා උපසර්ග පද වෙන වෙන ම ලියන්න.

"කල්ප ජහසිංහ වැනි ප්‍රබුද්ධයන් අද දක්නට නොලැබෙන අතර පොත්පත් නිතර පරිශීලනය කිරීම නිසා මේ තත්ත්වය ඔහුට හිමි විය. එතුමා සතු පරිගණක දැනුම ද අතිමහත් ය සුචරිත සමාජයක් උදෙසා මෙ බඳු අය අනුගමනය කිරීම නිවැරදි ය. අපි ඔහු අභිමානයෙන් හා සුහදව පිළිගනිමු. "

| නිපාත පද | උපසර්ග පද |
|---|---|
| (i) | (i) |
| (ii) | (ii) |
| (iii) | (iii) |
| (iv) | (iv) |
| (v) | (v) |
| (vi) | (vi) |
| (vii) | (vii) |
| (viii) | (viii) |

# ඒකකය - වතුර මල

**ගුරුභවතාගේ නම : එස්.එල්.එන්.ප්‍රියන්තා දිල්හානි - අම්/ මංගලාරාම මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 21

1) පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කෙටිකතාවක තේමාව හා කතා වින්‍යාසය යනු කුමක් ද?

........................................................................................................

........................................................................................................

ii. නිර්මාණකරණයේ දී කෙටිකතාකරුවාගේ වැඩිම අවධානය යොමු විය යුත්තේ කුමන කෙටිකතා අංගය කෙරෙහි ද?

........................................................................................................

iii. ශ්‍රේෂ්ඨ රුසියානු ලේඛක 'ඇන්ටන් චෙකොෆ්' කෙටිකතාව යන්න නිර්වචනය කළේ කෙසේ ද?

........................................................................................................

........................................................................................................

iv. කෙටිකතාව තුළින් සමාජය , ජීවිතය , මනුෂ්‍යත්වය කෙරෙහි ලේඛකයා හෙළන ආකල්පය කෙසේ හැඳින්වේ ද?

........................................................................................................

v. පහත දැක්වෙන චරිතයන්හි විශේෂ චරිත ලක්ෂණ තුන බැගින් ලියන්න.

| චරිතය | චරිත ලක්ෂණ |
|---|---|
| අබිලින් උන්නැහේ | 1.<br>2.<br>3. |
| සිරිමාන්න මහතා | 1.<br>2.<br>3. |
| ලොකු හාමුදුරුවෝ | 1.<br>2.<br>3. |

vi. 'යථාර්ථ නිරූපණය' ලෙස හැඳින්වෙන්නේ කුමක් ද?

........................................................................................................

........................................................................................................

vii. දෘෂ්ටි කෝණ වර්ග දෙක දක්වන්න.

........................................................................................................

viii. ජෝසප් බර්ග් එසන්වීන්ගේ කෙටිකතා නිර්වචනය ලියන්න.

........................................................................................................

........................................................................................................

ix. මෙම කෙටිකතාවේ අවසාන භාගය වන විට සිරිමාන්න මහතා විසින් ලෝකයා ඉදිරියේ මවාගෙන සිටි ප්‍රතිරූපය බිඳ වැටේ. මෙය කෙටිකතාව තුළ ප්‍රබල සංකේතයකින් නිරූපණය කර ඇත. ඒ සංකේතය කුමක් ද?

........................................................................................................

........................................................................................................

x. ‘සන්ධ්‍යා සමයේ සිසිලසින් මුළු පන්සල් වත්ත ම සන්සුන්ව ඇත්තා සේය.....‘ මෙම පරිසර වර්ණනය තුළින් ඔබට හැඟෙන්නේ කුමක් ද?

..................................................................................................................

..................................................................................................................

2) ඡේදයෙහි ඇතුළත් ඉරි ඇඳි පද කුමන ව්‍යාකරණ වර්ගයකට අයත්වේදැයි ලියන්න.

අබිලින් උන්නැහේට සිටියේ එක <u>ම</u> පුතෙකු පමණි. <u>ඔහු</u> ද විවාහයක් කරගෙන ගෙදර ම පදිංචි වී සිටියි. අබිලින් උන්නැහේ <u>විශාල</u> ධනවතෙකු <u>නො</u> වුවත් අවශ්‍ය දේට වියදම් කිරීමට <u>නිර්ලෝභී</u> ය. හොඳට හීල් බත් පිඟානක් <u>කා</u> දවස ආරම්භ <u>කරන</u> ඔහු දවල් දොළහ පමණ වන තුරු එක දිගට වැඩ කරයි. දවසේ වැඩ <u>අවසන් කර</u> ආපසු ගෙදර එන්නේ සැඳෑ අඳුර ගලා හැලෙන විටය.

3) පහත දැක්වෙන ප්‍රකාශයන්හි අවස්ථා සම්බන්ධය ලියන්න.

| ප්‍රකාශය | කිව්වේ කවුද? | කිව්වේ කාටද? | අවස්ථාව |
|---|---|---|---|
| i. ‘ඔව් ඉතින් ඔය වැඩේ නම් නරකයි කියන්න බැහැ‘ | | | |
| ii. ‘කෝපි කෝප්පයක් හදාගෙන වරෙල්ලා‘ | | | |
| iii. ‘වතුර මල නම් හරි ලස්සනයි‘ | | | |
| iv. ‘කතා කර කර හිටිය මදෑ. දැන් ඉතින් අපි යමු‘ | | | |
| v. පැන් ටික ගේන්න තියෙන්නේ පරණ මැටි කොතල කබලක්‘ | | | |

4) පහත දැක්වෙන ඡේදයෙහි ඇතුළත් යුගල පද වෙන් කර ලියන්න.

අබිලින් උන්නැහේ නිතර යමින් එමින් තම හිතවතාගේ දුක සැප සොයා බලා උදව් උපකාර කළේය. බෙත් හේත් සොයා දුන්නේ ය. සිරිමාන්න මහතා මියගිය පසු ආදාහන කටයුතු සඳහා ද වෙහෙස මහන්සි වී කටයුතු කළේ ය.

5) පහත දැක්වෙන පද සඳහා විරුද්ධ පද පාඩමෙන් උපුටා දක්වන්න.

i. පසමිතුරා - ..........................
vi. සරල - ..................................

ii. ලෝභී - ..............................
vii. අපකීර්තිය - ..........................

iii. ආයාසයෙන් - ........................
viii. නොසන්සුන් - ........................

iv. ආදායම - ............................
ix. පහසු - ...................................

v. අකාරුණික - ........................
x. සසල - ..................................

6) ඔබ කැමති තේමාවක් යටතේ කෙටිකතාවක් නිර්මාණය කරන්න.

# ඒකකය - පුවත්පත් වාර්තා දැන්වීම් හා ප්‍රායෝගික ලේඛන

**එච්.ඩබ්.තමරා නිල්මිණි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය - අම්පාර**

කාර්ය පත්‍රිකා අංක 22

1) පහත ඡේදය වරහන් තුළ ඇති වචන උපයෝගී කරගෙන සම්පූර්ණ කරන්න.

පුවත්පතක් යනු ........................................ ප්‍රකාශනයකි. පුවත්පතක ලක්ෂණ වන්නේ කටු හෝ ගම් භාවිතයෙන් එහි පිටු එකට .............................. නොතිබීමයි. වත්මන් පුවත්පත .............................. සියවසේ දී .................................................... භාවිතයෙන් .................................... මුද්‍රණ ශිල්පය ව්‍යාප්ත වීමෙහි ප්‍රතිඵලයකි. පුවත්පතක මූලික ම අංගය ............................................ වේ. ප්‍රවෘත්ති යන්නෙහි අර්ථය ................................ යනුයි. ඒ අනුව මේ මොහොතේ සිදුවන නව වැදගත් සිදුවීම් ඉන් අර්ථවත් වේ. ඉංග්‍රීසි හා යුරෝපීය භාෂාවලින් යෙදෙන .......................................... යන්නෙහි ද අර්ථය අලුත් ............................................... යන්නයි.

(යාන්ත්‍රික , පසළොස්වන , පවත්නා , නවතාවෙන් යුක්ත , මුද්‍රිත , NEWS , සචල අකුරු , අමුණා , ප්‍රවෘත්ති , )

2) දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

<u>පුවත්පත් වාර්තා</u>

i. ප්‍රවෘත්ති වාර්තාවක් සම්බන්ධයෙන් ප්‍රචලිත සම්මුතිය උපුටා දක්වන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

ii. ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී අවධානය යොමු කළ යුතු සම්මත කරුණු හත නම් කරන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

iii. ප්‍රවෘත්ති නිර්මාණය සඳහා ජනමාධ්‍යවේදීන් අතර පවතින සම්මත කරගත් W5H1 ක්‍රමවේදය ලියා දක්වන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

iv. ඔබේ විදුහලේ 'පනස් වසක අබිමන් මෙහෙවර' සංවත්සර උත්සවය ඇසුරු කරගනිමින් පුවත්පතකට වාර්තාවක් ලියන්න. (වචන 100 පමණ)

දැන්වීම්

i. දැන්වීම් පත්‍රිකාවක් සකස් කිරීමේ දී ඔබ විශේෂයෙන් සලකා බලන කරුණු හතරක් ලියන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................
.................................................................................................

ii. දැන්වීම් පත්‍රිකාවක් ඇගයීම සඳහා අනුගමනය කෙරෙන අයිඩා ආකෘතිය (AIDA Model) ලියන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................
.................................................................................................

iii. ඔබ විදුහලේ 'පනස් වසක අබිමන් මෙහෙවර' සංවත්සර උත්සවය ඇසුරු කර ගනිමින් එම උත්සවයේ විශේෂාංග දිනය , වේලාව ආදී තොරතුරු ඇතුළත් කරමින් ආකර්ෂණීය දැන්වීමක් පිළියෙළ කරන්න.(වචන 100 පමණ)

වෙළඳ දැන්වීම්

i. වෙළඳ දැන්වීමක් යනු කුමක්ද?

.................................................................................................
.................................................................................................

ii. වෙළඳ දැන්වීමක මූලික කාර්යයට අදාළ කරුණු හතරක් ලියන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................
.................................................................................................

iii. නිපුණ පරිගණක අධ්‍යාපන ආයතනය අ.පො.ස. (සා. පෙළ) නිම කළ සිසුන් සඳහා පරිගණක අධ්‍යාපනය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාවක් ඇරඹීමට සැලසුම් කර ඇත. ඒ පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට සුදුසු වෙළඳ දැන්වීමක් සකසන්න. එහි පාඨමාලා ගාස්තු , කොන්දේසි ආදිය ද ඇතුළත් විය යුතුය.

ආකෘති පත්‍ර

i. ආකෘති පත්‍රයකින් ඉටු වන ප්‍රධාන කාර්යය දෙක නම් කරන්න.

.................................................................................................
.................................................................................................

ii. ආකෘති පත්‍රයක් භාවිත කළ හැකි ප්‍රධාන අවස්ථා හතරක් නම් කරන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................
.................................................................................................

iii. ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමේදී ඔබ අනුගමනය කරන ක්‍රමවේදය නම් කරන්න.

.................................................................................................

iv. ඔබේ ජීව දත්ත ඇතුළත් කරමින් ආදර්ශ ආකෘති පත්‍රයක් සකසන්න.

# ඒකකය - සුභාෂිතය

**ගුරුභවතාගේ නම : එස්.එල්.එන්.ප්‍රියන්තා දිල්හානි - අම්/ මංගලාරාම මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 23

1) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. උපදේශ කාව්‍ය යනු මොනවා ද?

....................................................................................................

ii. සුභාෂිතය යන්නෙහි අර්ථය ලියන්න.

....................................................................................................

iii. සුභාෂිතය කතුවරයාගේ වෙනත් කෘතීන් නම් කරන්න.

....................................................................................................

iv. සිංහල උපදේශ කාව්‍ය ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| කෘතිය | කතුවරයා | සාහිත්‍ය යුගය |
|---|---|---|
| ලෝවැඩ සඟරාව | | |
| ලෝකෝපකාරය | | |
| සුභාෂිතය | | |
| සිරිත් මල්දම | | |

v. 'බාහිර පෙනුමෙන් මිනිසුන්ගේ සැබෑ තත්ත්වය හඳුනාගත නොහැක. ඔවුන්ගේ සත්‍ය ස්වභාවය වටහාගත හැක්කේ ක්‍රියාකාරීත්වය තුළින් පමණි.' මේ අදහස දෙන කවි පදය උපුටා ලියන්න.

....................................................................................................

....................................................................................................

vi. එම කවියෙහි උතුමන් හා පහත් ගති ඇත්තන් උපමා කර ඇත්තේ කා හට දැයි වෙන වෙනම ලියන්න.

....................................................................................................

vii. 'මුළු ලොව සැප සම්පත් සියල්ල හිමි වුව ද ගුණ ඇති පුද්ගලයන් උඩඟු නොවේ.' මේ අදහස දෙන කවි පදය උපුටා ලියන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

viii. උඩඟු නොවන ගුණවත් පුද්ගලයා උපමා කර ඇත්තේ කුමකට ද?

....................................................................................................

ix. 'බලවත් නායක ජනයාට කේළාම් බස් පැවසීමෙන් කේළාම් කරුවා ද ඔහුගේ වර්ගයා ද විනාශයට පත් වේ.' මේ අදහස දෙන කවි පදය ලියන්න.

....................................................................................................

....................................................................................................

x. එම කවියේ අදහස සරල බසින් ලියන්න.

....................................................................................................

....................................................................................................

2) පහත දැක්වෙන පද සඳහා පාඩමෙහි සඳහන් වූ වචනය කොටුව තුළින් තෝරා ලියන්න.

i. ඇත් රජු - ..............................
ii. ප්‍රභූන් - ..............................
iii. කපුටන් - ..............................
iv. අමෘත ජලය - ..............................
v. සර්පයෙක් - ..............................
vi. ප්‍රසිද්ධ - ..............................
vii. අඥාන - ..............................
viii. වීර - ..............................
ix. සාගරය - ..............................
x. වර්ගයා - ..............................
xi. අපාය - ..............................
xii. දිව්‍යලෝකය - ..............................
xiii. ඉක්මනින් - ..............................
xiv. සත්පුරුෂයා - ..............................
xv. විශාල - ..............................
xvi. ඝෝර - ..............................
xvii. වෛරය - ..............................
xviii. සම්පත් - ..............................
xix. උතුම් - ..............................
xx. නොගැළපෙන - ..............................

| | | | | |
|---|---|---|---|---|
| සුරපුර | නොපනත් | නිරය | තුමුල | සෙද |
| පසිඳු | සපෙක් | ඉසුරු | වගක් | ගොර |
| වෙර | වරණිඳු | සුදන | පවර | පබු |
| නුනුවණ | අමාදිය | වැර | රිවුන් | සිඳු |

3) පහත සඳහන් අදහස් දෙන පද්‍ය කොටස් උපුටා ලියන්න.

i. අමා රස බඳු මිහිරි අඹ රසය

..............................................................................................................

ii. සර්පයෙක් එක් තැනැත්තෙකුට දෂ්ඨ කළේ නම්

..............................................................................................................

iii. මේ මුළු ජම්බුද්වීපයෙහි රාජ්‍යශ්‍රීය ලැබුණත්

..............................................................................................................

iv. ස්ථිරසාර ගුණයෙන් යුත් සත්පුරුෂයෝ

..............................................................................................................

v. උතුම් දිව්‍යලෝකයෙහිවත්

..............................................................................................................

vi. නොගැළපෙන දෙයක් නොකරති

..............................................................................................................

4) යහපත් පුරවැසියෙකු ලෙස තම චරිතය හැඩගස්වා ගැනීමට සුභාෂිතයෙහි කවි තුළින් ඔබ ලබාගත් ආදර්ශ පහක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

# ඒකකය - අත්දැකීම් ප්‍රතිනිර්මාණය

**ගුරුභවතාගේ නම : එස්.එල්.එන්.ප්‍රියන්තා දිල්හානි - අම්/ මංගලාරාම ම. විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 24

1) පාඩම හොඳින් කියවා පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැන්වලට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

උසස් කලාකරුවා තමා විසින් අත්විඳින දෑ එලෙස ම තම නිර්මාණය තුළින් ඉදිරිපත් නොකරයි. ඔහු එම අත්දැකීම් ............................................... කරයි. සෑම රසිකයෙකු ම කිසියම් සාහිත්‍ය නිර්මාණයක් ............................................... කරන්නේ ඒ තුළින් පෙර නොඇසූ විරූ හෙවත් ............................................... අත්දැකීමක් ලබා ගනු සඳහා ය. කලාකරුවෙකු විසින් තම නිර්මාණයට තමා ඇසූ දුටු දෑ මෙන් ම සිතින් මවාගත් දෑ ද ඇතුළත් කරයි. මෙසේ සිතින් මවාගැනීම ............................................... ලෙස හඳුන්වයි. හොඳ නිර්මාණයකට පාදක වූ අත්දැකීම අපූර්ව විය යුතු මෙන් ම එහි ............................................... ද තිබිය යුතු ය. එසේ ම අත්දැකීම පාඨක ............................................... රැක ගැනීමට සමත් විය යුතුය. කලාකරුවෙකු තුළ සිය අත්දැකීම් අනුසාරයෙන් උපන් හැඟීම් ඒ අයුරින් ම රස විඳින්නා තුළ ද ඇතිවීම ............................................... නම් වේ. මේ අවස්ථාවේ දී නිර්මාණකරුවාත් රසවිඳින්නාත් යන දෙදෙනා ම සමාන හදවත් ඇත්තන් සේ සලකන අතර රසවිඳින්නා ............................................... ලෙස හැඳින්වේ.

(සහෘදයා , අපූර්ව , විශ්වසනීයත්වය , සහානුභූතිය , අර්ථාන්විතභාවය , ප්‍රතිනිර්මාණය , පරිකල්පනය , පරිශීලනය)

2) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හරවා ලියන්න.

i. එය හොඳ කතාවක් බව කවුරුත් පිළිගන්නවා.

...............................................................................................................

ii. එහි මහලු ගවයකු බිම ලැග විට සපමින් සිටිනු මම දුටුවා.

...............................................................................................................

iii. පුළුවන් තරම් පොත් කියවලා දැනුම ලබා ගන්ට ඕනෑ.

...............................................................................................................

iv. සාහිත්‍ය නිර්මාණ ශක්තිය දෙයාකාරයකින් ඇතිවෙනවා.

...............................................................................................................

v. මේවා සමහර විට කාව්‍යයේ වස්තු බීජය වෙන්ට පුළුවන්.

...............................................................................................................

3) ජී. බී. සේනානායක මහතා පවසන පරිදි අත්දැකීම් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

- ...............................................................................................................
- ...............................................................................................................

4) පහත සඳහන් සාහිත්‍ය නිර්මාණවල කතුවරුන් නම් කරන්න.

i. නිර්මාණය හා විචාරය - ..............................................................................
ii. නිර්මාණ පසුබිම - ..............................................................................
iii. වහල්ලු - ..............................................................................
iv. ගමන - ..............................................................................
v. මක් නිසාද යත් - ..............................................................................

5) පුස්තකාලය පරිශීලනය කරමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. මාර්ටින් වික්‍රමසිංහ සූරින්ගේ,
   a) නවකතා පහක්
   b) කෙටිකතා පහක්
   c) සාහිත්‍ය විචාර කෘති තුනක් නම් කරන්න.

ii. ජී. බී. සේනානායක මහතාගේ,
   a) නවකතා පහක්
   b) කෙටිකතා පහක්
   c) කාව්‍ය කෘති දෙකක් නම් කරන්න.

iii. මහගම සේකරයන්ගේ,
   a) නවකතා දෙක
   b) කෙටිකතාවක්
   c) කාව්‍ය කෘති පහක්
   d) ප්‍රකට ගීත පහක් නම් කරන්න.

6) මහගම සේකර කවියාගේ හඳ සහ නිව්යෝර්ක් නුවර කවි පන්තියෙහි ඇති උපමා සහ රූපක හඳුනාගෙන උපුටා දක්වන්න.

| උපමා | රූපක |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

7) හඳ සහ නිව්යෝර්ක් නුවර පද්‍ය නිර්මාණයට කෙටි රසාස්වාදයක් සපයන්න.

# ඒකකය - ශ්‍රී ලංකාවේ ජුරාසික යුගය

**ගුරුභවතාගේ නම : එස්.එල්.එන්.ප්‍රියන්තා දිල්හානි - අම්/ මංගලාරාම මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 25

1) පහත සඳහන් ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. පෘථිවියේ ආයු කාලය වසර බිලියන 4.5 කට වඩා පැරණිය. ( )

ii. මෙසොසොයික භූ යුගය යනු අදින් වසර බිලියන 225ක් තරම් මෑත අතීතය තෙක් අවදියයි. ( )

iii. මෙසෝසොයික අවදියේ මධ්‍ය භාගය (වසර මිලියන 201 – 145 දක්වා) ජුරාසික යුගයයි. ( )

iv. බහුසෛලික ජීවීන්ගේ ෆොසිල ජුරාසික යුගයේ දී ලංකාවෙන් හමු වී නැත. ( )

v. පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩවල පරිණාමය ජුරාසික යුගයේ දී සිදු වී ඇත. ( )

vi. ශ්‍රී ලංකාවේ ජුරාසික අවසාදිත තැන්පතු පිහිටි ස්ථානවන්නේ පල්ලම , තබ්බෝව හා ආඬිගම වේ. ( )

vii. තබ්බෝව ජුරාසික ශාක ෆොසිල එකතුවක් ප්‍රථම වතාවට සකස් කළේ එෆ්. ඩී. ඇඩම්ස් ය. ( )

viii. කොනිෆරස්, සයිකේඩ් හා පර්ණාංග ශාක ෆොසිල තබ්බෝව ජුරාසික ෆොසිල අතරින් හමුවිය. ( )

2) මෙම පාඩමෙහි භූගෝල විද්‍යා විෂයයට අදාළ පාරිභාෂික පද රැසක් හමු වේ. ඉන් පද පහක් ලියන්න.

i. ..........................................

ii. ..........................................

iii. ..........................................

iv. ..........................................

v. ..........................................

3) පහත දැක්වෙන වාක්‍යයන්හි ඇතුළත් උපසර්ග පද උපුටා ලියන්න.

i. 1942 දී ඉන්දියානු ජුරාසික ෆොසිලයන්ට වඩා මනාව සුරක්ෂිත වූ ශ්‍රී ලංකා ෆොසිල එකතුවක් පිළිබඳ අංග සම්පූර්ණ ශාස්ත්‍රීය ලිපියක් සම්පාදනය වී ඇත.

..........................................................................................................................

..........................................................................................................................

ii. ආඬිගම තැන්පතුව වර්තමානයේ දී පරිහානියට පත්ව ඇති බැවින් අනාගත පර්යේෂණ උදෙසා එය සංරක්ෂණය කළ යුතුව ඇත.

..........................................................................................................................

..........................................................................................................................

iii. ඇතැම් ෆොසිල ශාක පත්‍ර හා කුඩා අතු රිකිලි වශයෙන් එම අවසාදිත තුළ විශේෂ සලකුණු ලෙස සුරක්ෂිතව තිබිණි.

..........................................................................................................................

..........................................................................................................................

4) පහත දැක්වෙන පදවලට සමානාර්ථවත් පද පාඩමෙන් උපුටා ලියන්න.

i. ලේඛනය - ..............................

ii. භාරකයේ - ..............................

iii. සපිරුණු - ..............................

iv. භූමිය - ..............................

v. පාංශු - ..............................

vi. හෙළිදරව්ව - ..............................


vii. සුරැකීම - ..............................

viii. දූපතෙන් - ..............................

ix. මීවන - ..............................

x. කෙටි - ..............................

5) පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




උපකාරක පද

- පහළට
  1. තබ්බෝව පුරාසික තැන්පතු පිළිබඳ මුලින් ම වාර්තා කළ විද්‍යාඥයා මොහු ය.
  2. මඩු ගසට යෙදෙන නමකි.
  6. ජලය මගින් රැගෙනවිත් කරනු ලබන කාබනික හෝ ඛනිජමය තැන්පත් ස්ථර මෙසේ හැඳින්වේ.
  7. ඉන්දියාවේ ශ්‍රී ලංකාවට සමගාමීව පිහිටා ඇති පුරාසික ශාක පොසිල තැන්පතුව මෙසේ හඳුන්වයි.
  8. ඉන්දියාවේ පිහිටි කඳුවැටියකි.
  10. පාෂාණීභූත වූ ශාක හෝ සත්ත්ව කොටස් හඳුන්වන නම
- හරහට
  3. ශ්‍රී ලංකාවේ පිහිටි පුරාසික තැන්පතු සහිත ස්ථානයකි.
  4. රළු කණිකාමය පාෂාණ වර්ගයකි.
  5. විශාල ගොඩබිම් ප්‍රදේශ එක්ව සැදුණු පද්ධතිය මෙසේ හඳුන්වයි.
  7. කේතුධර ගස් හඳුන්වන නමකි.
  9. ගංගාවක් මුහුදට වැටෙන අවස්ථාවේ දී අතු ගංගා කිහිපයකට බෙදී පැවතීම
  11. අපුෂ්ප ශාකයකි.
  12. පර්ණාංග ශාක පොසිල විශාල ප්‍රමාණයක් හමු වූයේ මෙම තැන්පතුවෙනි.

6) පහත දැක්වෙන විරාම ලක්ෂණ අර්ථවත් වන සේ වාක්‍ය බැගින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | තිත (.) | vi. | දෙතිත (:) |
| ii. | කොමාව (,) | vii. | යුගල උඩු කොමා(“ ”) |
| iii. | ප්‍රශ්නාර්ථ ලකුණ (?) | viii. | තනි උඩු කොමා (‘’) |
| iv. | විස්මයාදී ලකුණ (!) | ix. | කෙටි ඉර (-) |
| v. | තිත් කොමාව (;) | x. | ඇල ඉර (/) |

# ඒකකය - තල මල පිපිලා

**ගුරුභවතාගේ නම : පී.එල්.අයි.චතුරාණි - අම්/ නුගේලන්ද විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 26**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට පෙර පාඩම ඉතා හොඳින් කියවන්න.
- සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

(01)

i. වේදිකා නාට්‍ය පිළිබඳ ව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා නිර්වචනය කර ඇත්තේ කෙසේ ද?

ii. " නාට්‍යයක් මුලින් ම රඟ දැක්වෙන්නේ රචකයාගේ සිත නැමති වේදිකාව මත ය" මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

iii. චතුර් අභිනය ලියා දක්වන්න.

iv. තල මල පිපිලා නාට්‍යයේ රචකයා නම් කරන්න.

v. එතුමා රාජ්‍ය සාහිත්‍යය සම්මානයෙන් පිදුම් ලැබූ නාට්‍යය දෙකක නම් ලියන්න.

vi. තල මල පිපිලා නාට්‍යයේ රචකයා විසින් ලියූ ළමා කෘති දෙකක නම් ලියන්න..

vii. එතුමා අතින් ලියවුණු කෙටි කතා සංග්‍රහ දෙකක නම් ලියන්න.

viii. 'තල මල පිපිලා' නාට්‍යයේ තේමාව කුමක් ද?

ix. 'තල මල පිපිලා' නාට්‍යයේ සාර්ථකත්වය සඳහා යොදා ගෙන ඇති සාම්ප්‍රදායික කලාංග මොනවා ද?

x. රංබරණාගේ චරිතයේ දැක ගත හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න.

xi. තල මල පිපිලා නාට්‍යයේ බටහිරකරණය සංකේතවත් කරන චරිතය කුමක් ද?

xii. මෙම නාට්‍යය තුළ දැකිය හැකි කපටි ආත්මාර්ථකාමී අදහස්වලින් යුතු ඉතාම සූක්ෂම උපායවන්තයා කවුරුන් ද?

xiii. නාට්‍යය රස වින්දනය වැඩි දියුණු කිරීමට රචකයා යොදාගත් සාම්ප්‍රදායික යෙදුම් සඳහා උදාහරණ නාට්‍යයෙන් උපුටා ලියන්න.

xiv. තල මල පිපිලා නාට්‍යය තුළ 'ව්‍යවහාර ගැමි බස' යොදා ගත් අවස්ථාවක් දැක්වෙන උදාහරණයක් උපුටා ලියන්න.

xv. ඔබට නිර්දිෂ්ට නාට්‍ය තුළ අඩංගු උපහාසාත්මක අවස්ථාවක් උපුටා දක්වන්න.

(02) ප්‍රස්තාව පිරුළට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

i. වලිගෙ ගිනි ගත්තු ........................................................ වගේ.

ii. ඔන්විල්ලාව එහාට ගියත් ........................................................ එනවලු.

iii. අත දිල ........................................................ වගේ.

iv. උඩ බලන් ........................................................ ගැහුවා වගේ.

v. අනුන්ගේ පානෙන් ........................................................ බලනවා වගේ.

( එළිය , දත නියවනවා , හනුමලා , කෙළ , මෙහාට )

(03) දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහස වඩාත් වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

i. ඉතා අමාරුවෙන් යමක් ලබා ගැනීම.
ii. කිසිම ආකාරයකින් නිදහසක් නොමැති වීම.
iii. පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට තවත් විපතකට මුහුණ පෑම.
iv. අනුන් රැවටීමට ගොස් තමන්ම රැවටීම.
v. අනවබෝධයෙන් යමක් කිරීම .

(04) පහත දැක්වෙන අවස්ථාව සඳහා ගැළපෙන රූඪිය තෝරා යා කරන්න.

| | |
|---|---|
| කැලෑ නීතිය | විනාශය ළං වෙලා |
| මර ඇඳේ | හෙමින් වැඩ කිරීම |
| කණ කොකා හඬලා | ලැජ්ජාවට පත් වුණා |
| කටු අත්තක් | අන්තිම අවස්ථාව |
| සායම ගියා | බලවතා දුබලයා වීම |
| ගොළුබෙලි ගමන | නිතර දබර කරන |

(05) දී ඇති රූඪි පද යොදා අර්ථවත් වාක්‍යය සකස් කරන්න.

I. හමස් පෙට්ටියට යාම.
II. දෙහි කැපුවා.
III. එක පයින්.
IV. ලෑල්ලට පෑගුවා.
V. කජු කන්නා සේ

(06) පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

I. එතෙර -
II. තොවිල් -
III. දනි -
IV. කොට්ට -
V. කර -

# ඒකකය - අඟුල්මල් දමනය

**ගුරුභවතාගේ නම : පී.ඩී.එස්.ජේ. සෝමරත්න - අම්/උහන තිස්සපුර විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 27

- අදාළ පාඩමේ සාහිත්‍ය පසුබිම ඇසුරින් හිස්තැන් සම්පූර්ණ කරන්න.

(01) 1. පාඩම උපුටාගත් ග්‍රන්ථය - ..................................................

2. එහි කර්තෘ -................................................

3. එය ලියැවුණු යුගය - ....................................................

4. එම ග්‍රන්ථය ලිවීමට මුල් වූ බුදු ගුණය - ..................................................

5. එම ග්‍රන්ථයේ අන්තර්ගත පරිච්ඡේදය ගණන හා අඟුල්මල් දමනය අයත් පරිච්ඡේදය - .................

6. අමාවතුර රචනා කිරීමෙහි කතුවරයාගේ බලාපොරොත්තුව - .................................

7. සිංහල කතා කලාව අනුව මෙම ග්‍රන්ථයේ විශේෂත්වය - .................................

8. අහිංසක අංගුලිමාල බවට පත් වීමට බලපෑ හේතු - ....................................

9. අහිංසකගේ මව් පිය දෙදෙනා වන්නේ - .....................................

10. අහිංසක අංගුලිමාල නමින් ඇමතීමට හේතුව - ....................................

11. අංගුලිමාලගේ පිය බමුණු පවසන අන්දමට විශ්වාස කළ නොහැකි සතර දෙනා

I. .................................. III. ................................
II. .................................. IV. .................................

12. අඟුල්මල් තෙරුන්ට/රහතුන් වහන්සේට මුහුණ දීමට සිදු වූ අභියෝග වන්නේ,

I. ......................... III. .........................
II. ........................ IV. .........................

**(02)** පහත සඳහන් වචන ලිහිල් බසින් ලියන්න.

1. අරණ්‍යයෙහි
2. පිළිවිත
3. ධර්මාන්තේවාසික
4. මාණවකයා
5. තුන් රුසක් වැ
6. අටවිමධ්‍යයෙහි
7. වග වග වැ එති
8. බැල පමණින් දිවෙයි
9. වෙළෙවි වැ
10. ප්‍රතිමුක්ත

**(03)** පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

I. "ඇපි අන්නට හිංසා නොකරන කුලෙහි උපන්නම්හ. එ සේ නොකොට හැක්කැ"යි කී යැ.

අ) මෙය කා විසින් කා හට කරන ලද ප්‍රකාශයක් ද?

ආ) මීට ලැබෙන පිළිතුර කුමක් ද?

II. "වහන්සේ මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති."

අ) මෙම ප්‍රකාශය කෙරෙන ස්ථානය ලියන්න.

ආ) මෙම ප්‍රකාශය කරන තැනැත්තා එම ස්ථානයට පැමිණීමට හේතුව ලෙස දක්වන්නේ කුමක් ද?

III. "මම් සතර පසයෙන් උපස්ථාන කෙරෙම්ව"යි කී යැ.

අ) මෙහි සඳහන් සතර පසය නම් කරන්න.

ආ) මෙම ප්‍රකාශය කරමින් මේ තැනැත්තා කළ දේ කුමක් ද?

IV. "කපුටු බලු ආදීන් නෙරනා සඳහා වටා හීසනක් පමණ තන්හි යම් කවර දිශාභාගයෙකින් දමා - ලූ දඬු පහණ හකුරු අවුත් මහ තෙරුන් මැ වෙරු හෙයි"

අ) මෙහි ඉරි ඇඳි පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

ආ) මීට බුදුරජාණන් වහන්සේ ලබා දෙන විසඳුම කුමක් ද?

**(04)** අංගුලිමාල දමනය රසවත් කිරීමෙහි ලා

1. සංක්ෂිප්ත රීතිය අනුගමන කිරීමත්
2. සංවාදශීලී බස් වහර භාවිතයත්

යන භාෂා ප්‍රයෝග ඉවහල් වී ඇති අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසන්න.

**(05)** 1) අවස්ථා හා සිද්ධි නිරූපණයට

2) සදුපදේශ මතුකොට දැක්වීමට

අමාවතුර කතුවරයා ගත් උත්සාහය සාර්ථක වී ඇති අයුරු අඟුල්මල් දමනය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

**(06)** අඟුල්මල් දමනයේ සාර්ථකත්වයට කතු භාවිත කළ රචනෝපක්‍රම පිටිවහල් වී ඇති අන්දම උදාහරණ තුනක් ගෙන සාකච්ඡා කරන්න.

**(07)** දරුණු පුද්ගලයෙක් සීලසංයමයක් ඇති අයෙකු බවට පත් වුවද සෙසු අය තුළ ඔහු කෙරෙහි ඇති බිය ඉක්මනින් තුරන් නොවන වග අඟුල්මල් දමනය ඇසුරින් උදාහරණ තුනක් ගෙන සනාථ කරන්න.

# ඒකකය - උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 28

1) අදාළ පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

I. 'ලදොත් ජීවත් වෙමි. නො ලදොත් මියෙමි'

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කතා පුවත කුමක් ද ? ..........................................

(ආ) මෙම කතා පුවත ඇතුළත් කෘතිය හා කතුවරයා නම් කරන්න

..........................................................................................................................................

II. (අ) එම කෘතියට මූලාශ්‍ර වූ කෘතිය හා කතුවරයා නම් කරන්න.

.....................................................................................................................................

(ආ) ධම්මපදට්ඨකතාව යනු කුමක් ද ? ...........................................................................

III. බණ කතා රීතිය යනු කුමක් ද ? ............................................................................................

..........................................................................................................................................

IV. 'ම දුව විකුණන්නා නැත.'

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය රචනා වූයේ කිනම් සාහිත්‍ය යුගයක ද ?

(ආ) එම කෘතියෙහි ඇතුළත් කතා ගණන කීය ද ? ...................................................

V. "උග්ගසේන නම් සිටුපුත්‍රයාට ශිල්ප දක්වන්නට කියව"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද ? ...........................................

(ආ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව ලියන්න. ..................................................

..........................................................................................................................................

VI. "ගැල් රකිනවුගෙ පුත" "බර උසුලනවුන්ගෙ පුත," "කුමකුත් නො දත්තවුන්ගෙ පුතැ"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද ? කිනම් අවස්ථාවක ද ? ...............................

..........................................................................................................................................

(ආ) මෙහි සඳහන් පුතාගේ පියා විසින් කරනු ලබන කාර්යයන් කවරේ ද ?

..........................................................................................................................................

VII. "අපට භයෙක් නැතැ"

(අ) මෙහි 'අපට'යනුයෙන් පවසන්නේ කවරෙක් ද ? ...................................................

(ආ) ඔහු භය නොවන්නේ කවර කාර්යයක් සඳහා ද ? ...............................................

VIII. "නිවන් දකුමෝ ව!"

(අ) මෙසේ ප්‍රාර්ථනා කළේ කවරෙක් ද ? ......................................................................

(ආ) ප්‍රාර්ථනයට පෙර සිදු කළ කාර්යය කුමක් ද ? .......................................................

IX. "එසේ වී නම් මම උන් හා එක් වෙමි."

(අ) මෙහි 'මම'යන්නෙන් හඳුන්වන්නේ කවරෙක් ද ? ..................................................

(ආ) ඒ හා සබැඳි අවස්ථාව කුමක් ද ? ..........................................................................

X. "තොප නිසා විද්දත් වූවා මඳින් නපුරුත් ඇසුව මනා ද ?"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අය කවරෙක් ද ? .......................................................

(ආ) මෙහි 'නපුරුත්'යනුවෙන් දක්වන්නේ කුමක් ද ? ..................................................

2) පහත සඳහන් ගද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

i. එ හෙයින් දිවසින් බලනුවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාව දැන සිනා පහළ කළහ. දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණත් විචාර නො පියා සමණන්ට "මුන් වහන්සේ සිනාවක් **සී-පී** සේක.විද්දත් කමෙක් ඇති වනැ" යි කිවූ ය.

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.......................................................

(ආ) මෙහි සඳහන් තැනැත්තා සිනා පහළ කළ හේතුව කුමක් ද ?...................................

..........................................................................................................................

ii. එදවස් බුදුහුත් අලුයම් වේලේ ලොව බලන සේක් හුණදඬු අගට නැංගෙන්නාට පෙරාතු ව තමන් වහන්සේගේ නුවණ නමැති හුණදඬු අග හුන්නවුන් දැක, වන්නේ කුමක් දෝ හෝ යි බලන සේක් 'සිටුපුත් තෙමේ ශිල්ප දක්වමි කියා ලා හුණදඬු අග සිට්ටි.

(අ) හුණදඬු අග සිටියේ කවුද ? ඒ ඇයි ? ..............................................................

..........................................................................................................................

(ආ) මෙහි දැක්වෙන රූපකය උපුටා දක්වන්න....................................................

iii. දෙ මවුපියෝ ඒ අසා "පුත, තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නො වෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙම්හ" යි කිවූ ය.

(අ) 'තොපටත් අපටත් තරම් නොවෙයි' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?

..........................................................................................................................

(ආ) දෙමව්පියෝ දරුවාගේ ප්‍රශ්නය විසඳීමට උත්සාහ කළේ කෙසේ ද ?

..........................................................................................................................

iv. උග්ගසේනයෝ සිටු කුලයෙහි ඉපදැත් විද්දැත් සැටි යැ යි කියා ලූ බස ගිවිස පමණෙකින් තුමූ නො විද්දත් වත් විද්දතුන් හා එක් වූ ය. රහත් තෙරුන්ට දී ලූ බත් පාත්‍රයෙහි අනුසසින් උග්ගසේන තෙරහු රහත වූ හ.

(අ) මෙහි උග්ගසේන සිටුපුත්‍රයාගේ පෙර ආත්ම තොරතුරු හෙළි කරන්නේ කවරෙක් ද ?

..........................................................................................

(ආ) ඒ අනුව සිටුපුත්‍රයා,

විද්දතුන් හා එක්වීමට හේතු වූ කරුණ - ....................................................

..........................................................................................................................

රහත් වීමට බලපෑ කරුණ - .................................................................................

..........................................................................................................................

3) *අනුන් පහත් කොට සලකමින් ඔවුනට නින්දා අපහාස නො කළ යුතු බව,

*උත්සහවන්තයා ජය ගන්නා බව,

පැවසීමට කතුවරයා දැරූ උත්සාහය සාර්ථකය.'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' කථාව ඇසුරෙන් එක් කරුණකට උදාරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

4) 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව'කථාවේ කතුවරයා සතු ප්‍රතිභාපූර්ණත්වය මැනවින් විදහා දැක්වෙන්නේ,

*කතාවේ සංසිද්ධිවලට උචිත ලෙස චරිත හැසිරවීම,

*මැනවින් භාෂාව හැසිරවීම,

යන කුසලතා නිසාය.එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

5) සද්ධර්මරත්නාවලියෙහි අන්තර්ගත කතා වස්තුවල දැකිය හැකි ලක්ෂණ 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' කථාවේ ද දක්නට ලැබේ. උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

# ඒකකය - කෑරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 29**

01) අදාළ පාඩම ඇසුරෙන් සුදුසු පද යොදා, හිස්තැන් සම්පූර්ණ කරන්න

i. හංසයකු දූතයා ලෙස යොදා ගත් සංදේශ කාව්‍යය.................. සංදේශයයි.
ii. එය රචනා වූයේ .................... රාජධානි සමයෙහි......................... රජ දවස ය.
iii. එහි රචකයා ......................................... මා හිමි වේ.
iv. උන් වහන්සේ රචනා කළ වෙනත් කෘති ........................... , ...............................
v. කැරගල යනු .......................... පළාතේ ........................... පිහිටි විශාල ගමකි.
vi. මෙම කැරගල නම් ගම 'රසවාහිනිය' නම් කෘතියෙහි සඳහන් වන්නේ .................................. නමිනි
vii. කැරගලට එම නම ලැබීම පිළිබඳ ජනප්‍රවාද -
- ...............................................................................................
- ...............................................................................................

viii. හංස සංදේශයේ ඇතුලත් කවියකි.

කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරුය.
........................................................ ................
........................................................ ................
........................................................ ................

02) පහත සඳහන් පද්‍ය පාඨ ඇසුරින් අසා ඇති ප්‍රශ්නනවලට කෙටි උත්තර ලියන්න.

i. සාර පලය අඹ දඹ රඹ ද **වල්** පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට
නෑර ලොලය වඩවන **දුටු** දනන් හට
කැර ගලය වැජඹෙයි මේ ලෙසින් සිට

අ). තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
ආ). මෙහි ඇතුළත් අනුප්‍රාසාත්මක යෙදුම් උපුටා දක්වන්න

ii. දුටු සත සිතට තුටු වන ලෙසට නිතියෙනි
සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි
පැහැපත සුද නොකළ වැලි අතුළ මළු තැනි
මිහිකත සඳන' ලෙව් දුන උර මඩල වැනි

අ). කවියේ සඳහන් උපමා උපුටා ලියන්න
ආ).විහාරයේ මිදුල සකස් කොට තිබූ ආකාරය ලියන්න

iii. නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණුය
ගෙයක් කන ම **සැදැහෙන්** දෙවන **දකුණුය**
සුදක් ලෙස තිබෙයි **මළු** මං හැර කුණුය
සියක් අය කෙරෙහි වැඳ පුද **පැදකුණුය**

අ). තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
ආ). මෙම කවියෙන් කියවෙන අදහස ලිහිල් බසින් ලියන්න.

iv. නුදුරු වැ සිහිලැ'ලී ය ගහලැ' ලීය
වට සැදි මල් වැ ලීය සුදු වැලීය
පිපි වන සිටි ම ලීය වන මලීය
තුටු වන සිති වි ලීය පුල් වීලීය

අ). දිය ඇලි, පිපුණු මල් ඇති විල් යන අරුත් දීමට කවියා භාවිතා කළ යෙදුම් උපුටා දක්වන්න.
ආ). වෙහෙරට ආසන්නයෙහි වූ පරිසරයේ සුනදරත්වය කවියා දුටුවේ කෙසේ ද?

v. පැසෙහි නිබඳ සුවදැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

අ). මෙම ප්‍රෙද්ශයේ කෘෂිකාර්මික කටයුතු සිදු කෙරෙන පැවසීමට දක්වා ඇති සාධක කවරේ ද ?

ආ). කවියේ සඳහන් උපමාව හා උපමේය වෙන්කොට ලියන්න

03) හංස සංදේශය රසවත් කාව්‍ය නිර්මාණයක් වී ඇත්තේ,

i. ස්වභාව සෞන්දර්යය මැනවින් වර්ණනා කිරීම.

ii. කැරගල ප්‍රදේශයේ ජන ජීවිතය හා බැඳුණු සමාජ ආර්ථික තොරතුරු විවරණය කිරීම.

යන කරුණු නිසාය .නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

04)
- සංකල්ප රූප නිරූපණයක්
- ගමක සුන්දරත්වය විදහා පෑමක් නිසා හංස සංදේශය සහෘද සිත් අමන්දානන්දයට පත් කිරීමට සමත් වෙයි.

නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

05) ස්වභාවෝක්තිය තුළින් පාඨකයාට සමීප වූ හංස සන්දේශය සාර්ථක පද්‍ය නිර්මාණයකි. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

06) කැරගල ගම්පියසෙහි ආගමික පසුබිම නිරූපණය කිරීමට කවියා දැරූ උත්සහය සාර්ථකය හංස සංදේශයේ නිර්දේශිත කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

07) අපූර්ව වූ කාව්‍යෝපක්‍රම භාවිතයෙන් රසනිෂ්පත්තියට යොමු වූ කවියාගේ දක්ෂතාව පිළිබිඹු හංස සන්දේශය නිර්දිෂ්ට උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

# ඒකකය - මග විසිතුරු

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ ම. විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 30

1) අදාළ පාඩම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

I. 'වන්දිමි හිමි වලා - තො ගොසින් ඇය නිවෙස්නට
පිරිබුන් පගා මලයුත - දිවොට තො හදහව කිය කියයි'
සංදේශ ස්වරූපයක් ගන්නා මෙම ගීය කවරකු විසින්, කිනම් ස්ථානයක ලියා තිබේ ද ?............................................................ , .............................................................

II. සංදේශ කාව්‍ය යනු කවරේදැ යි හඳුන්වන්න. ...................................................
..........................................................................................................................

III. (අ) සංදේශ කාව්‍ය ඉතිහාසයේ පළමු සංදේශ කාව්‍ය කුමක් ද ? ...............................................
(ආ) එහි කතුවරයා කවරෙක් ද ? .......................................................................

IV. (අ) සිංහල සංදේශ සාහිත්‍ය ඉතිහාසයේ පැරණිතම සංදේශය සහ එය රචිත යුගය ලියන්න.
සංදේශය - ............................................ යුගය - ......................................................

(ආ) සිංහල සංදේශවල දැකිය හැකි ලක්ෂණ කවරේ ද ?.................................
..........................................................................................................................
..........................................................................................................................

V. (අ) සිංහල සංදේශ කාව්‍යයේ ස්වර්ණමය යුගය නම් කරන්න. ............................
(ආ) එකල ඇති වූ සාහිත්‍ය ප්‍රබෝධයට ඉවහල් වූ කරුණු මොනව ද ?
..........................................................................................................................
..........................................................................................................................

VI. (අ) 'මඟ විසිතුරු' පැදි පෙළ, ඇතුළත් කෘතියේ නම ලියන්න....................................
(ආ) එම කෘතිය රචනා කිරීමට මුල් වූ අරමුණ කුමක්ද ? ..........................................
..........................................................................................................................
..........................................................................................................................

VII. (අ) එම කෘතියේ කතුවරයා හා සාහිත්‍ය යුගය නම් කරන්න.
................................................ , ..................................................
(ආ) එහි ඇතුළත් පද්‍ය ගණන කීය ද ? .......................................................

VIII. කෘතියේ දූත ආශිර්වාදය සඳහා යොදා ගත් කවි වල විරිත් නම් කරන්න
.............................................. , ..............................................

IX. සු ර ර ද සමන් සමගින් සුර'හන එ වර
.............................................................. ..........
.............................................................. ..........
සකි ස ද පෙනේ සමනොළ ගල නැගෙන හිර

(අ) මෙම කවියේ ඉතිරි පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍ය රචකයා විසින් ලියන ලද කෘති හතරක් නම් කරන්න ............................ ,
.......................... , .......................... , ..............................

X. මග විසිතුරු පද්‍ය පන්තියේ කතුහිමියන් දැන සිටි භාෂා හය කවරේ ද ?
..........................................................................................................................

2) පහත සඳහන් ගද්‍ය පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. වල දින අදහසින් මෙන් සුර ගඟ අභන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන

(අ) කවියේ ඇතුළත් අනුප්‍රාසාත්මක යෙදුම් මොනවා ද ? ..........................................................
..............................................................................................................................
(ආ) මෙහි දැක්වෙන උපමාව හා රූපකය උපුටා දක්වන්න
උපමාව ..................................................... රූපකය ...................................................

ii. වනසිරි පියුම්රා බඳ රන'බරණ යුරු
වටපිරිසුපුල් දුනුකේ මල් මුරුත'තුරු
බිඟුපිර වැරූ ඔලු'පුලැ'ඕලුවල තඹුරු
හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මීතුරු

(අ) ඉරි ඇඳි පදවල අරුත් ලියන්න. ..........................................................................................
..............................................................................................................................
(ආ) කවියා පරිසරයේ විචිත්‍රත්වය දක්වා ඇත්තේ කෙසේ ද ? .................................................
..............................................................................................................................

iii. නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ
සුපුල් මල් යහන් ලිය මඩු ලිය ගෙ පෙළ
එකල් කෙළන වන දෙව් ලිය දැකැ කොමළ
ළසල් රුකෙක සැතැපෙව ළපලු සිහිල'ළ

(අ) වන දෙව්ලියෝ විනෝද වූයේ කෙසේ ද ? ..................................................................................
..............................................................................................................................
(ආ) මෙහි අවසන් පද පේළියේ අර්ථය පැහැදිලි කරන්න. .........................................................
..............................................................................................................................

iv. රිවිතැවුලේ පිපි කමලේ විල් ගැවැසී
මතකොවුලේ තුරු වදලේ හඬන නිසී
වනසැවුලේ මහ අසලේ පොර සැලැසී
ගුරුබැවුලේ යව අවුලේ නොවී කිසී

(අ) ඉරි ඇඳි පද වල අරුත් පැහැදිලි කරන්න. ..............................................................................
..............................................................................................................................
(ආ) 'ගුරු බැවුල' නම් ප්‍රදේශයේ සතුන්ගේ හැසිරීම් වලාසය දක්වන්න....................................
..............................................................................................................................

3) සැළලිහිණි සංදේශය,
අර්ථ රසයෙන්
ශබ්ද රසයෙන්
අනූන රසවත් පද්‍ය නිර්මාණයකි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

4) ස්වභාවසෞන්දර්යය
මිනිස් චර්යාවන්
විචිත්‍ර ලෙස වර්ණනා කිරීම සැළලිහිණි සංදේශයේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

5) උචිත කාව්‍යෝපක්‍රම භාවිතය නිසා සැළලිහිණි සංදේශය කතුවරයාගේ දක්ෂතාව පිළිබිඹු කරයි. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

# ඒකකය - කුරහන් ඉසිමුව කළුවර බලාලා

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 31

1) අදාළ පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I.
දුරුතු මහේ දී කැලයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා

(අ) මෙම කවිය ඇතුළත් පද්‍ය පන්තියේ නම ලියන්න

.............................................

(ආ) මෙම කවිය කිනම් ජන කවි ප්‍රවර්ගයට අයත් වේද ?

.......................................

II. (අ) කුරක්කන් කවි මඟින් මූලික වශයෙන් ප්‍රකාශ කරන්නේ කවර

III. කරුණක් ද ? ................................................................................................

(ආ) කුරක්කන් කවි තුළ අන්තර්ගත කරුණු ලියන්න.

.........................................................................................................................

IV.
හෙනේ පැලේ මා විදිනා සුරුක්කන්
...................................................................
...................................................................
අපොයි මගේ කිරි වදිනා කුරක්කන්

(අ) මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙහි කාව්‍ය ආකෘතිය ලියන්න. ............................................................

2) පහත දැක්වෙන පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i.
එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සියුපාවෝ බොහොම
ගොල්ල සමඟ එති උ◌ඟරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම

(අ) 'ගොල්ල සමඟ එති උ◌ඟරෝ සැමදාම' යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

..............................................................................................................

(ආ) සත් දවසකින් නිල්ල වැදී සරුසාරව වැඩෙන්නේ මොනවා ද ?

..............................................................................................................

ii.
කටු ඇල්ලේ මහ හේනේ කුරක්කන්
වැට අහුරා උ◌ඟරන්ගෙන් වළක්කන්
කර ගන්නට බැරි උන් මහ කුරක්කන්
උ◌ඟරෙනි නොකා පලයව් මගෙ කුරකුකන්

(අ) මෙහි සඳහන් තැනැත්තා වැට අහුරන්නේ ඇයි ? .........................................

(ආ) ඔහුගේ අසරණ බව ප්‍රකාශ කෙරෙන ඉල්ලීම කුමක් ද?

..........................................................................................................................

iii.
මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්
රන්වන් කරල් බර වී ඇති සුරක්කන්
උ◌ඟරෝ නොකෑවොත් හේනේ කුරක්කන්
බඩගින්නට අවුසදයකි කුරක්කන්

(අ) මෙහි සඳහන් තැනැත්තාට සතුටුවිය හැකි කරුණු කවරේ ද ?

..............................................................................................................

(ආ) මෙහි පවත්නා අවිනිශ්චිත බව කුමක් ද ?

..............................................................................................................

iv. කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ
කපන්නටත් බැරුව අතපය රුදාවේ
අරින්ටත් බැරුව ලොවග ම සිනාවේ
කපමු නැනේ ඉපනැල්ලේ සුබාවේ

(අ) කුරක්කන් ගොවියා මුහුණ දුන් ගැටළු කවරේ ද ?..............................
..........................................................................................................

(ආ) 'අරින්නටත් බැරුව ලොවග ම සිනාවේ' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද ?
..........................................................................................................

v. එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්
මහ යන්නෝ මට සරදම් කරක්කන්
එපෙති වෙන්ඩ කවුදැයි කළ නරක්කන්
කපා ගනිමු එක පෙත්තේ කුරක්කන්

(අ) මෙහි සඳහන් තැනැත්තා හාස්‍යයට ලක්වන බව පවසන්නේ ඇයි ?
..........................................................................................................

(ආ) ඔහු උත්සාහය අත් නො හරින බව ප්‍රකාශ වන පද පේළිය උපුටා දක්වන්න. ..........................................................................................................

3) ජන කවියේ එන

- සරල සුගම බස් වහර,
- අව්‍යාජ බව,

මැනවින් සුසංයෝග කිරීම 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' පද්‍ය පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇත.එක් කරුණකට උදාහරණ දෙකක්වත් දක්වමින් විස්තර කරන්න.

4) *හේන් ගොවියා මුහුණ දෙන ගැටලු,
*ඔහුගේ නොපසුබට උත්සාහය,
සහෘදයා වෙත සමීපකරවන්නට සමත් වූ 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' පද්‍ය පන්තිය රසවත් නිර්මාණයකි.එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

5) 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' පැදි පෙළෙන් හේන් ගොවිතැන් කරන ජනතාවගේ ජීවිතය විනිවිද දකින්නට සමත් වූ සාර්ථක නිර්මාණයකි. උදාහරණ තුනක්වත් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

6) සංකල්පරූප දනවන බස්වහරක් භාවිත කළ කවියාගේ සාර්ථකත්වය 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' පද්‍ය පන්තියෙන් ප්‍රකට වේ. උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

7) තමන්ට බොහෝ හිරිහැර ඇති වුව ද, සතුන් කෙරේ කරුණාව දක්වන හේන් ගොවියාගේ උදාරත්වය පිළිඹිබු කරවන'කුරහන් ඉසිමුව කළුවර බලාලා'පද්‍ය පන්තිය රසබර නිර්මාණයකි.පැදි පෙළ ඇසුරෙන් නිදසුන් තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

# ඒකකය - අපට වැසිකිළියක්

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 32

1) අදාළ පාඩම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

"දැන් නම් හරි ඩාදිය අක්කේ, හවසට අඹරමු."

I. මෙම ප්‍රකාශය උපුටා ගෙන ඇත්තේ කිනම් කෙටිකතාවෙන්ද?
.....................................................................................

II. එය ඇතුළත් කෙටිකතා සංග්‍රහය කුමක්ද?
.....................................................................................

III. එහි කතුවරයා නම් කරන්න .....................................................................

IV. ඔහුගේ මුල් කෘතිය හා එය පළ කළ වර්ෂය ලියන්න ........................................................ ,
......................................................

V. රචකයාගේ සාහිත්‍ය නිර්මාණ වෙන්කොට දක්වන්න.

- කෙටිකතා සංග්‍රහ - ...................................... , ................................
  ...................................... , ................................
- නවකතා සංග්‍රහ - ...................................... , ................................
  ...................................... , ................................
- ළමා කෘති - ...................................... , ................................

VI. ඔහුට රාජ්‍ය සම්මාන හිමිවූයේ කවර නවකතා සඳහාද ? ........................................................
...................................................... , ...................................................... ,
......................................................

VII. විශිෂ්ට ලේඛකයකු ලෙස විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දක්ෂතාපෙන් වූ ඔහුට හිමි වූ සම්මාන දෙකක් ලියන්න. ...................................... , ......................................

'යාන්තම්වත් තාත්තාට මේ බව ඇසුණොත් මට සෙල්ලම් නටන්නට ලැබෙන්නේ නැත.'

VIII. මෙම ප්‍රකාශය ඇතුළත් කතාවේ දෘෂ්ටිකෝණය ලියන්න ........................................................
.....................................................................................................
...............

IX. "ඕවා ගිහින් කියනවා මට නෙමෙයි, උසාවියට. කෝ වළ කපලද ?"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවනය කළ අයගේ නම කුමක්ද ? ..................................................

(ආ) ඒ හා සැබැඳි අවස්ථාව ලියන්න. ..................................................

X. "එහෙම දෙයක් ගැන අහලවත් නැතුව ඇති මයෙ හිතේ."

(අ) මෙහි 'එහෙම දෙයක්' යනුවෙන් දක්වන්නේ කුමක් ද ? ...............................

(ආ) මෙම සාකච්ඡාවට සම්බන්ධ වූ අමුත්තා කවරෙක් ද ? ...............................

2) පහත දැක්වෙන ගද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

1. 'ඒ එක්කම ඇගේ කටට අගුලු වැටෙයි.මම මගේ නිදහස ලබමි.'

(අ)මෙහි නිදහස ලබන්නේ කවරෙක් ද ? ..................................................

(ආ)'ඇගේ කටට අගුලු වැටෙයි' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ?

.....................................................................................................

2. 'කෙසේ වුවද මෙය මට ම තනි කර තබා ගැනීමට තරම් 'බර වැඩි'අත්දැකීමක් විය.

(අ) මෙහි අත්දැකීම බර වැඩි බව පවසන්නේ ඇයි?..............................................

...................................................................................................................................

(ආ) ඔහු මුහුණ දුන් ගැටළුව කුමක්ද ? ..............................................................

...................................................................................................................................

3. 'දැන් එය තාත්තාට වුව ද ප්‍රයෝජන ගැනීමට අසීරු නොවන ස්ථානයක් වී ඇත. එහෙයින් ඔහු එහි යන මුත් පැරණි ඇබ්බැහිකම්වල නෂ්ටාවශේෂයක් හැටියට ඉන් අනතුරුව වත්ත පහළ දිය පාර වෙත යයි.

(අ)' නෂ්ටාවශේෂයක්' යන්නෙහි අර්ථය ලියන්න ..............................................

...................................................................................................................................

(ආ) මෙහි සඳහන් පරිදි අතීත පුරුද්දක් අත් නො හැර සිටින්නේ කවරෙක් ද ?

.........................................................................................

4. 'නඩු, උසාවි යනු බොහෝ ගැමියන්ට මෙන් ම තාත්තාට ද රෞරව නරකය වැනි භයානක දේවල් ය. මේ නිසා ගෙදරට පුංචි පැටියකු ඇති වූවාක් මෙන්, ගේ කිට්ටුව පුංචි වැසිකිළියක් තැනිණ.

(අ) මෙහි ඇතුළත් උපමා හා උපමේයයන් වෙන්කොට ලියන්න.

උපමාව ............................ උපමේය ...................................

(ආ). උපමාව ............................ උපමේය ...................................

3) අපට වැසිකිළියක් කෙටිකතාවෙන් වැසිකිළි භාවිතය පිළිබඳව,

- ගැමියන් තුළ වූ දැනුම හා ආකල්ප
- ගැමියන් වෙනස් කිරීමට ගත් උත්සාහය

මැනවින් විවරණය කිරීම එහි සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

4) * ගැමි බස්වහර භාවිත කරමින්
* සංකේත භාවිත කරමින්

භාෂාව මැනවින් හසුරුවාගත් අපට වැසිකිළියක් කෙටිකතාව රසවත්ව ව නිර්මාණය කිරීමට රචකයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

5) 'අපට වැසිකිළියක්'කෙටිකතාව පාඨක අවධානය දිනාගත් සාර්ථක කෙටිකතාවක් ලෙස අගය කළ හැකි ය. කෙටිකතා ලක්ෂණ ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

6) ළමා ලෝකයේ සුන්දරත්වය හා ඔවුන් ලබන අත්දැකීම් තුළින් ජීවිතය වෙනස් කරන බැව් පැවසීමට කතුවරයා ගත් උත්සාහය සාර්ථකය.'අපට වැසිකිළියක්' කෙටිකතාවෙන් නිදසුන් තුනක්වත් යොදා ගනිමින් විස්තර කරන්න.

7) සහෘදයා තුළ කුතුහලය දනවන ආකාරයෙන් අවස්ථා හා සිද්ධි ගළපමින් නිර්මාණය කිරීම 'අපට වැසිකිළියක්' කෙටිකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත. උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

# ඒකකය - දියමන්ති මාලය

**ගුරුභවතාගේ නම : පී.ඩී.එස්.පේ.සෝමරත්න - අම්/උහන තිස්සපුර විද්‍යාලය**

කාර්ය පත්‍රිකා අංක 33

**1)** පහත සඳහන් ප්‍රශ්නවලට ඇති සියලුම අනු කොටසකටම කෙටි පිළිතුරු ලියන්න.

I. "ඔන්න ඔයාට බඩුවක් තියෙනවා"

(අ) මෙය ශ්‍රවණය කළේ කවුද?

(ආ) මෙහි බඩුවක් ලෙසින් නම් කළේ කුමක් ද?

II. "මේක මට ණයට දෙන්න පුළුවන් ද? මේක විතර ම යි මං ඉල්ලන්නේ"

(අ) මෙහි ණයට ඉල්ලුවේ කුමක් ද ?

(ආ) මෙය ඇතුළත් සාහිත්‍යාංගය නම් කරන්න.

III. "මල් ටිකක් ගහ ගන්නකෝ"යි ඇගේ සැමියා පැවසීය.

(අ) මෙහි සඳහන් ඇගේ සැමියා කවුද?

(ආ) මෙය ඇතුළත් කෙටි කතාවේ මුල් ම කතුවරයා නම් කරන්න.

IV. "අනේ මගේ අසරණ මැටිල්ඩා...ඔයා කොච්චර වෙනස් වෙලා ද?"

(අ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෙටි කතාවේ පරිවර්තකයා නම් කරන්න.

V. සුමානයක් ගත වෙත්ම ඔවුන්ගේ බලාපොරොත්තු සියල්ල ම සුන් වී ගියේය.

(අ) මෙහි ඔවුන් ලෙස හැඳින්වුණු අයගේ නම් ලියන්න.

(ආ) මෙම පාඨය ඇතුළත් කෙටි කතාව ලියවී ඇති දෘෂ්ටි කෝණය/කථන ක්‍රමය නම් කරන්න.

**2)**

I. උස් කරකින් යුත් වූ ඇඳුමට උඩින් ගෙල වටා එය බැඳගත් ඇ කැටපත ඉදිරියට ගොස් තම දර්ශනයෙන් තොමෝ ම <u>වශීකෘතව</u> <u>ප්‍රහර්ෂයෙන්</u> ටික වේලාවක් බලා ගත් වන ම බලා ගෙන සිටියා ය.

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ආ) ඔබ දන්නා විදේශීය කෙටි කතාකරුවන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

II. ඔහු පොලිස් ස්ථානයට ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලයටත් කුලී රථ සමාගම්වලටත් ගොස් මේ ගැන දැනුම් දුන්නේ ය.

(අ) ඔහු නමින් හඳුන්වන තැනැත්තා ඉහත සඳහන් ස්ථානවලට ගොස් දැනුම් දුන් කාරණය කුමක් ද?

(ආ) මින් කියවෙන තැනැත්තාගේ රැකියාව කුමක් ද?

III. "මීට කලින් නේද මේක ගෙනත් දෙන්න තිවුණේ ? මටත් ඕක ඕන කෙරුවා නම් එහෙම"

(අ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය සඳහන් කෙටිකතාවට පසුබිම් වන්නේ කවර සමාජ පන්තියක් ද?

IV. "මට නම් මේ එක්කෙනාව අඳුනන්න බෑ"යි ඇ ගොත ගසමින් පැවසුවා ය.

(අ) මෙසේ හඳුනා ගැනීමට බැරි තරම් මෙහි සඳහන් කෙනා වෙනස් වූයේ ඇයි?

(ආ) ඔබ දන්නා පරිවර්තන කෙටිකතා දෙකක නම් ලියන්න.

V. ඊට පසු දින තම මිතුරිය බැලීමට ගිය ඇ තමාට මුහුණ පාන්නට වී ඇති දුෂ්කරතාව ගැන ඇයට කීවා ය.

(අ) මෙහි සඳහන් ඇයට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතාව කෙටියෙන් ලියන්න.

(ආ) කෙටිකතාවක ලක්ෂණ දෙකක් ලියන්න.

VI. කිව නොහැකි තරම් වේදනාවකින් පීඩිත වූ ඇ ඔහු දෙසට හැරුණා ය.

(අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෙටිකතාවේ කතුවරයා රචනා කර ඇති කෙටිකතා ගණන කොපමණ ද?

3) දියමන්ති මාලය කෙටිකතාවේ මැටිල්ඩා ,

I. අතෘප්තිකර දිවියක් ගෙවූ

II. ඒ නිසා ම අවාසනාවන්ත සිද්ධියකින් බොහෝ පීඩාවට පත් වූ කාන්තාවකි.

එක් කරුණකට නිදසුන් දෙක බැගින් ගෙන මෙම කියමන සනාථ කරන්න.

4)

I. අවස්ථා හා සිද්ධි නිරූපණය

II. උචිත භාෂා ප්‍රයෝග භාවිතය

නිසා දියමන්ති මාලය කෙටිකතාව පාඨක සිත් සතන් ඇද බැඳ ගැනීමට සමත් වී ඇති අයුරු එක් කරුණකට නිදසුන් දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

5) දියමන්ති මාලය කෙටි කතාවේ එන ලොයිසල් මහතා ගැටලුවලට උපේක්ෂාවෙන් මුහුණ දෙන දයාබර සැමියෙකු වග නිදසුන් තුනක් ඇසුරින් විමසන්න.

6) මැටිල්ඩා වැනි චරිත නූතන සමාජයේ ද විරල නොවේ. ඔවුනට දියමන්ති මාලය කෙටි කතාවෙන් ගෙන එන්නේ කදිම පණිවිඩයකි. නිදසුන් තුනක් ඇසුරින් ඔබේ අදහස් දක්වන්න.

7) ෆොරෙස්ටියර් මහත්මිය කලණ ගති ගුණවලින් යුතු තැනැත්තියක් බව දියමන්ති මාලය කෙටිකතාව ඇසුරින් නිදසුන් තුනක් ගෙන පැහැදිලි කරන්න.

# ඒකකය - දෑතේ කරගැට සිඹ සනසන්නට

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය**

## කාර්ය පත්‍රිකා අංක 34

1) අදාළ පාඩම ඇසුරෙන් ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

I. (අ) 'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න .......................................................

(ආ) පද්‍ය පන්තිය ඇතුළත් කෘතිය කුමක් ද? ........................................

II. (අ) එම පද්‍ය පන්තිය 'ප්‍රාර්ථනා' නමින් රචනා කළේ කවරෙක් ද ?

.................................................

(ආ) 'ප්‍රාර්ථනා' පද්‍ය පන්තිය ඇතුළත් කෘතිය කුමක් ද ?

..............................................

III. (අ) මෙම පැදි පෙළ ගීතයක් ලෙස සංගීතවත් කළ අයගේ නම ලියන්න.

..................................................

(ආ) එය ගුවන් විදුලි ගීයක් ලෙස ගායනා කළ අයගේ නම ලියන්න.

..................................................

IV. (අ) ඔහුගේ දක්ෂතා ප්‍රදර්ශනය වූයේ කවර සාහිත්‍යාංග ඔස්සේ ද ?

...............................................................................................................

(ආ) අපේ ජන ගී සාම්ප්‍රදය හා සම්භාව්‍ය සාහිත්‍ය මැනවින් සම්මිශ්‍රණය වී තිබුණේ ඔහුගේ කවර සාහිත්‍යාංග වල ද ? ......................................................

V. (අ) ඔහු විසින් රචිත නවකතාවක් ඔහු අතින් එම නමින් ම සිනමා කෘතියක් බවට පත් වී ඇත. එය නම් කරන්න ...........................................

(ආ) ඔහුගේ නාට්‍ය කොටස් කීයකට බෙදිය හැකි ද ? ඒ මොනවා ද ?

...............................................................................................................

VI. විවිධ සාහිත්‍යාංග ඔස්සේ දක්ෂතතා පෙන්නු ඔහුගේ සාහිත්‍ය නිර්මාණ දෙක බැගින් ලියන්න.

- කාව්‍ය කෘති - ........................................................................................
- නාට්‍ය - ........................................................................................
- ගීත - ........................................................................................
- නාට්‍ය ගීත - ........................................................................................
- නවකතා - ........................................................................................

VII. (අ) ඔහු විසින් රචිත එහෙත් ඔහු මියගිය පසු ප්‍රකාශයට පත් වූ කාව්‍ය කෘතියක් නම් කරන්න .....................................................

(ආ) මියගිය අයකු පර්යේෂණ නිබන්ධයක් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාදියෙන් පිදුම් ලද ප්‍රථම අවස්ථාව සනිටුහන් කළේ මෙතුමාගෙනි.මියගිය ඔහුට එම ආචාර්ය උපාදිය පිරිනමා ඇත්තේ කිනම් පර්යේෂණ ග්‍රන්ථය සඳහා ද ?

.........................................................................................

2) පහත දැක්වෙන පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි
සහදිය මුතු මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි

(අ) කවියා ශ්‍රමයේ වටිනාකම පවසන්නේ කෙසේ ද ?

.........................................................................................

(ආ) මෙහි දැක්වෙන රූපකය උපුටා දක්වන්න.

.........................................................................................

ii. දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ

(අ) කවියා දකින ආකාරයට මෙරට සිදු වී ඇති නව වෙනස කුමක් ද ?

........................................................................................................................................

(ආ) 'සත් රුවනින් නව නිදහස් මතු වී'යන්නෙන් අදහස් කරන්නේ කුමකු ද ?

........................................................................................................................................

iii. දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැත බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පද වල අර්ථ දක්වන්න.

.............................................. , ..................................................

(ආ) කවියා දරුවාගේ අනාගතය දකින්නේ කෙසේ ද?

........................................................................................................................................

iv. මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදනු පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහි වන විට පුංචි පුතුන්

(අ) මෙම පද්‍යයෙහි ආකෘතිය ලියන්න ......................................

(ආ) කවියාගේ ගත වෙහෙස නැති වන්නේ කෙසේ ද ? ..........................................

3) 'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තිය තුළින්

- වත්මන් ශ්‍රමිකයාගේ වටිනාකම
- අනාගත පරපුරේ සිහින

එකිනෙකට යා කරන්නට රචකයා ගත් උත්සාහය සාර්ථකය.එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

4) *අතීත ශ්‍රී විභූතිය

* රටේ ජාතිකාභිමානය

මැනවිනන් නිරූපණය කරන්නට කවියා ගත් උත්සාහය 'දෑතේ කරගැට සිඹ සනසන්නට'
පද්‍ය පන්තියෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් ලියන්න.

5) අනාගත පරපුර වෙනුවෙන් වර්තමානය කැපකරන මිනිසුන්ගේ උදාරත්වය විවරණය කරන්නට කවියා සමත් වී ඇත.'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තියේ නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

6) 'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තිය මැනවින් හසුරුවන ලද සිත්ගන්නා සුළු බස්වහරකින් පෝෂිත නිර්මාණයක් ලෙස අගය කළ හැකි ය.උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

7) සැම දහදිය බිඳුවකට ම වටිනාකමක් එක් කරමින් සමෘද්ධිමත් දේශයක් ගොඩනැංවීමට දල්වා සිටින අපේක්ෂාවන් ප්‍රතිනිර්මාණය කිරීමට කවියා සමත් වී ඇත.උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

# ඒකකය - වස්සානය

**ගුරුභවතාගේ නම : පී.ඩී.ආර්.සෝමරත්න - අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය**

## කාර්ය පත්‍රිකා අංක 35

1) අදාළ පාඩම ඇසුරෙන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

I. කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට
දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවා ද ?
පුර පසේ සඳ එක්ක තරගයට මෝරන්ට
හුලංදා ඔය කිම් ද මල්වරව ඉල්මහට ?

(අ) මෙහි පද්‍ය උපුටාගෙන ඇත්තේ කිනම් පද්‍ය පන්තියෙන් ද ? ................................

(ආ) එම පද්‍ය පන්තිය ඇතුළත් කෘතිය නම් කරන්න ................................................

II. (අ) එම කෘතියේ රචකයා කවරෙක් ද ? ................................................

(ආ) මෙම පද්‍ය පන්තියට පදනම් වූ කවියාගේ රාජකාරී කටයුතු ආශ්‍රිත අත්දැකීම ලියන්න. ................................................

III. (අ) රචකයා අයත් සාහිත්‍ය යුගය ලියන්න ................................................

(ආ) මොහු වඩාත් ජනප්‍රිය වූයේ කවර සාහිත්‍යාංග හා සම්බන්ධ වීමෙන් ද ?
................................................

IV. (අ) පද්‍ය පන්තියේ කාව්‍ය ආකෘතිය කුමක් ද? ................................................

(ආ) ඔහුගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය හා එය පළ කළ වර්ෂය ලියන්න
................................ , ................................

V. (අ) ඔහු මෙරට පුවත්පත් කලාව වෙනුවෙන් කළ මෙහෙය කවරේ ද ?
................................ , ................................

(ආ) ඔහු මහාචාර්ය සුචරිත ගම්ලත් සමඟ එක්ව රචනා කළ කෘතිය කුමක් ද ?
................................................

VI. (අ) ඔහුගේ නිර්මාණ දිවිය පිළිබඳව විවරණය කරමින් ලිය වී ඇති විද්වත් ලිපි රැසකින් සමන්විත කෘතියේ නම ලියන්න. ................................................

(ආ) මෙම විශිෂ්ට සාහිත්‍යධරයාට ජපානයේ හිමි වූ සම්මානය කුමක් ද ?
................................................

VII. මෙහි සඳහන් රචකයාගේ සාහිත්‍ය නිර්මාණ දෙක බැගින් නම්කොට ඒ සඳහා සම්මාන ලැබී ඇත්නම් එය ද සඳහන් කරන්න.

- කාව්‍ය කෘති - උදා: සුබ උදෑසනක් රාජ්‍ය සම්මාන
  - ................................................
  - ................................................
- ගීත සංග්‍රහ
  - ................................................
  - ................................................
- ළමා කෘති
  - ................................................
  - ................................................
- ලිපි සංග්‍රහ
  - ................................................
  - ................................................
- ගී
  - ................................................
  - ................................................

2) පහත සඳහන් පද්‍ය පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔය දැල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද ?
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක

(අ) මෙහි ඇතුළත් උපමාව ලියන්න. ................................................

(ආ) 'ඔය දැල දොඩමලුය, සුවඳ බැරුවා ඉන්ට' යන්නෙන් අදහස ලියන්න................................................
................................................

2. දෙවැට දිග කරඳවැල් ආරුක්කු යට සැඟව
නිල් කුරුලු බිලිඳු නිදි, ඇහැරවන්නේ කුමට ?
රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය
මිහිරි මවුකිරි වගේ පොවන්නෙමි නුඹලාට

(අ) මෙහි ඇතුළත් උපමාව සහ උපමේය වෙන් කොට ලියන්න.

............................................................ , ............................................................

(ආ) පරිසරයේ පවත්නා වැහි බර ස්වභාවය කවියා දකින්නේ කෙසේ ද ?

..........................................................................................................................

3. සෙනේහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ
දිය නිලන වැසි සමේ රැලි නගා උතුරා ය
තඹර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින
ඔබේ සිනාවෙන් නිවේ හුණුව ගිය ලේ නහර

(අ) මෙම කවියෙහි සඳහන් රූපකාර්ථවත් යෙදුමක් උපුටා දක්වන්න.

..........................................................................................................................

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

..........................................................................................................................

4. ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැලිව
ඇදී ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය
දුෂ්කර ය කියා හැර යා යුතු ද ජීවිතය ?
කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

(අ) කවියා සඳහන් කරන පරිදි ගිම්හාන කාලයේ දී ගංගාවේ දක්නට
ලැබෙන ස්වභාවය පැහැදිලි කරන්න. ............................................................

(ආ) මෙහි අවසන් පද පේළි දෙකෙන් ප්‍රකාශ වන අදහස ලියන්න.

..........................................................................................................................

3) වස්සාන සමයෙහි,

*පරිසරයේ සිදුවන වෙනස්කම්,
*සතුන්ගේ හැසිරීම් රටාවේ දක්නට ලැබෙන වෙනස්කම්,
විචිත්‍ර ලෙස වර්ණනා කිරීමට කවියා සමත් වී ඇත.එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

4) *අජීව වස්තූන්ට සජීවත්වය ආරෝපණය කිරීම,
*සහෘදයා තුළ අපූර්ව වූ චිත්තරූප දැනවීම,
යන කරුණු නිසා වස්සානය පැදි පෙළ වඩාත් සිර්ථක වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

5) වස්සානය පැදි පෙළ මගින් අභියෝගාත්මක මිනිස් ජීවිතය පිළිබඳව විවරණය කරන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

# ඒකකය - සිංහල සාහිත්‍ය ඉතිහාසය සැකෙවින්

**ගුරුභවතාගේ නම : පී.ඩී.එස්.පේ සෝමරත්න - අම්/ උහන තිස්සපුර විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 36**

1) අදාළ පාඩම කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

1. (අ) පැරණි ම සිංහල නිර්මාණාත්මක ලේඛන අපට හමු වන්නේ කවර ලේඛන අතරින් ද ? ..........................................

   (ආ) එම ලේඛන බහුතරයක් අයත් වන්නේ කවර අවධියට ද ? ..............................

2. (අ) දැනට හමු වී ඇති පැරණි ම සිංහල කෘතිය නම් කරන්න................................

   (ආ) එහි කර්තෘ නම් කරන්න. ..................................................

3. (අ) ඉපැරණි විනය ග්‍රන්ථයක් නම් කරන්න..........................................

   (ආ) සාමණේර භික්ෂූන් සඳහා විනය නීති සංග්‍රහයක් වූ කෘතිය කුමක් ද ?

   ............................................................

4. (අ) දණ්ඩි නැමැති භාරතීය පඬිවරයාගේ කාව්‍යාදර්ශ නම් අලංකාර ග්‍රන්ථයේ අනුවාදයක් වන ග්‍රන්ථය කුමක් ද ? ..........................................

   (ආ) එහි කතුවරයා නම් කරන්න.........................................................

5. (අ) දොළොස්වන සහ දහතුන්වන සියවස් අතර කාලයේ දී බිහි වූ කාව්‍ය ග්‍රන්ථ තුනක් නම් කරන්න. ..........................................................

   (ආ) ඒ අතරින් සිංහල සාහිත්‍යයේ විශිෂ්ටතම පද්‍ය කෘතිය ලෙස සැලකෙන ග්‍රන්ථයේ නම ලියන්න. ..........................................................

6. (අ) අමාවතුර හා ධර්ම ප්‍රදීපිකාව යන කෘතිවල කර්තෘ කවරෙක් ද ?

   ..........................................................................

   (ආ) බුත්සරණ කෘතියේ කතුවරයා හා එය රචිත යුගය නම් කරන්න

   ..........................................................................

7. පහත සඳහන් ග්‍රන්ථ අධ්‍යයනයට ලක් කරනු ලබන්නේ කවර ශාස්ත්‍රවලට අදාළ ව දැ යි ලියන්න.

   (අ) සිදත් සඟරාව - ..........................................................

   (ආ) එළු සඳැස් ලකුණ - ..................................................

8. (අ) දීර්ඝ ගද්‍ය ග්‍රන්ථ හා සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලිවීම ආරම්භ වූයේ කවර සියවස් හි දී ද ? ..................................................

   (ආ) එසේ නිර්මාණය වූ ප්‍රධාන දීර්ඝ ගද්‍ය ග්‍රන්ථ දෙක හා තවත් එක් ග්‍රන්ථයක් පිළිවෙළින් ලියන්න. ..................................................

9. සිංහල සාහිත්‍යයේ මහා කාව්‍ය අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| මහා කාව්‍ය ග්‍රන්ථ | යුගය | කර්තෘ |
|---|---|---|
| | | |
| | | |

10. (අ) පැරණි ම සිංහල සිවුපද කාව්‍ය ග්‍රන්ථ දෙක නම් කරන්න.

   .................................................... ....................................................

   (ආ) සන්දේශ සාහිත්‍ය යන්නෙහි අර්ථ දක්වන්න ..................................................

   ..........................................................................

11. පහත සඳහන් හිස්තැන් සම්පූර්ණ කරන්න.

(අ) පහළොස්වන සියවසේ ලියවුණු සන්දේශ කාව්‍ය ග්‍රන්ථ හය වන්නේ,

1. ............................................ 2). ............................................

3). ............................................ 4). ............................................

5). ............................................ 6). ............................................

(ආ) මෙම අවධියට අයත් සුවිශේෂී ග්‍රන්ථ තුන හා එහි කතුවරු වන්නේ,

1) ............................................ ............................................

2) ............................................ ............................................

3) ............................................ ............................................

12. (අ) සම්භාව්‍ය සාහිත්‍ය ගණයට අයත් ග්‍රන්ථ පෙළෙහි අවසාන පුරුක ලෙස සැලකෙන ග්‍රන්ථය වන්නේ, ............................................

(ආ) එහි කර්තෘ වන්නේ, ............................................

- සාහිත්‍යකරණයට රජුන්ගේ දායකත්වය ලැබීම ලංකා ඉතිහාසයේ මුල් අවධියේ සිට සොළොස්වන සියවස දක්වා කැපී පෙනෙන ලක්ෂණයකි.

13. ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| (අ) ගත් කතුවරුන් වූ රජවරු | (ආ) අයත් යුගය |
|---|---|
| 1) ............................................ | ............................................ |
| 2) ............................................ | ............................................ |
| 3) ............................................ | ............................................ |
| 4) ............................................ | ............................................ |
| 5) ............................................ | ............................................ |

14. සාහිත්‍යකරණයට අනුග්‍රහය දැක් වූ රජවරු හා ප්‍රභූවරු

1) ............................................ 4) ............................................

2) ............................................ 5) ............................................

3) ............................................ 6) ............................................

15. (අ) විදේශීය ආක්‍රමණ නිසා පරිහානියට පත් සාහිත්‍යයට නව ප්‍රබෝධයක් ලබා දුන් සඟ රුවන වන්නේ, ............................................

(ආ) ප්‍රභූ ජනයා හා භික්ෂූන්වහන්සේලා ප්‍රමුඛව නියැලුණු ග්‍රන්ථකරණයට සාමාන්‍ය ජනතාව ප්‍රවිෂ්ට වීම පිළිබඳ නිදසුන් සපයන විශේෂ ම කෘති ද්විත්වය වන්නේ ............................................ හා ............................................

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඥ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |